# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2017** නොවැම්බර් **21** වන අඟහරුවාදා
2017 கார்த்திகை 21 செவ்வாய்க் கிழமை
Tuesday 21st November 2017

බත්තරමුල්ල**,** ශ්‍රී ජයවර්ධනපුර**,** ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ**,** අංක **204** හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා.** 09. 44 ට **පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.44 **க்கு சபை கூடியது**
*The Provincial Council met at 09.44 a.m.*

ගරු සභාපතිතුමා **[**සුනිල් විජේරත්න මහතා**]** මූලාසනාරූඪ විය.
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*අද දින න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුත්ත ලෙස ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කිරීමට නියමිත 2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමේ කටයුතුවලට ප්‍රමුඛතාවය ලබා දී ඇති බව ගරු ඔබතුමන්ලා වෙත දැනුම් දෙනවා.*

*ii*

*මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය පැවැත්වෙන දිනවලදී එනම්, 2017 දෙසැම්බර් මස 05, 06, 07, 08, 11 සහ 12 යන දිනවල සභා රැස්වීම ආරම්භ වන වේලාව පෙ.ව. 9.00 වන බව ගරු මන්ත්‍රීවරුන් වෙත සිහිපත් කරනවා. එම නිසා එම දිනවල පෙ.ව. 9.00 ට පෙර පැමිණෙන මෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා.*

*ඊළඟ නිවේදනය.*

*බස්නාහිර පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත*

*ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි,*

***2018 මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම සහ 2017 වර්ෂයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් සමඟ පැවැත්වෙන වැඩමුළුව.***
***හම්බන්තොට ෂැන්ග්‍රිලා හෝටලය***
***2017 නොවැම්බර් 28,29 සහ 30***

*2018 මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම සහ 2017 වර්ෂයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් සමඟ පැවැත්වෙන නේවාසික වැඩමුළුව නොවැම්බර් මස 28, 29 සහ 30 යන දිනයන්හිදී හම්බන්තොට ෂැන්ග්‍රිලා හෝටලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී.*

*02. මෙම වැඩමුළුවට සහභාගී වන මෙන් ඔබතුමාට/ඔබතුමියට ගෞරවයෙන් ඇරයුම් කරමි.*

*03. වැඩමුළුවට සහභාගී වීම සඳහා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රයේ සිට හම්බන්තොට ෂැන්ග්‍රීලා හෝටලය දක්වා යාමට සහ එහි සිට බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රය දක්වා පැමිණීමට ප්‍රවාහන පහසුකම් සූදානම් කර ඇත. (2017.11.28 දින පෙ.ව. 8.30 ට මෙම බස් රථ සෙත්සිරිපාය පරිශ්‍රයෙන් පිටත්වීමට නියමිත ය.)*

*04. මෙම වැඩමුළුව පැවැත්වෙන ස්ථානයේ නවාතැන් පහසුකම් සැපයිය හැක්කේ පැමිණෙන බව සනාථ කළ ගරු මන්ත්‍රීවරුන්ට පමණක් වන අතර, ගරු මන්ත්‍රීවරුන්ගේ රියදුරන්, ආරක්ෂක නිලධාරීන් හා පෞද්ගලික කාර්ය මණ්ඩලයේ කිසිවෙකුට නවාතැන් පහසුකම් හා ආහාර පාන සැපයිය නොහැකි බව කාරුණිකව සඳහන් කරමි. එම*

*තත්ත්වය මත වැඩමුළුවට සහභාගී වන සියලුම ගරු මන්ත්‍රීවරුන් සෙත්සිරිපාය පරිශ්‍රයේ සිට පිටත්වන බස් රථ මගින් ප්‍රවාහන පහසුකම් සලසා ගනු ඇතැයි අපේක්ෂා කරමි.*

05. *වැඩමුළුව පැවැත්වෙන හම්බන්තොට ෂැන්ග්‍රිලා හෝටලය වෙත ප්‍රධාන ආහාර වේල් හා තේ පැන් සංග්‍රහයක්ද, නවාතැන් හා පුහුණු පහසුකම් ද වෙනුවෙන් පළාත් සභාව වියදම් දරනු ලබන අතර, අමතර පහසුකම් හෝ ආහාරපාන සපයා ගන්නේ නම්, ඒ සඳහා පෞද්ගලිකව වියදම් දැරිය යුතුය.*

06. *මෙම වැඩමුළුවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමා/ඔබතුමිය පෞද්ගලිකවම ලබා දෙන සහයෝගය බෙහෙවින් අගය කරමි.*

*ස්තූතියි.*
*මෙයට - විශ්වාසී,*

*හේමන්ත සමරකෝන්,*
*ලේකම්,*
*බස්නාහිර පළාතේ පළාත් සභාව.*

වැදගත්ම දේ තිබෙන්නේ වෙලාවට පැමිණීම. ඒ එක්කම අත්සන් කරපු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා නේ? පැමිණීම සම්බන්ධව අපි ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ ලේඛනයේ ගොඩක් මන්ත්‍රීවරු, මම හිතන්නේ 80% ක් විතර අත්සන් කරලා තිබෙනවා, පැමිණෙනවාය කියලා. ඒ නිසා අනිකුත් මන්ත්‍රීවරු අපි අගය කර සලකනවා. 8.30 ට පිටත් වීමට අවශ්‍ය නිසා කොහොම හරි වෙලාවටම පැමිණෙන්න. නිලධාරීන්ටත් ඒ ටිකම තමයි. නිලධාරී මහත්වරුත් ඒ විධියටම එන්න. අපේ ලේකම්තුමන්ලා, ලේකම්තුමියන්ලා සහ අනෙකුත් අය. අපිත් එක්ක යන්න එන්න. 8.30 ට පෙර. පෞද්ගලිකව යන අයගේ රියදුරන්ට ඒ පහසුකම් දෙන්න විධියක් නැහැ.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු මහේෂ් අල්මේදා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Mahesh Almeda [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ වූ පළාත් පාලන ආයතන 07 ක් සම්බන්ධයෙන් වූ ගිණුම් කාරක සභා වාර්තා කාණ්ඩ අංක 01 හා කාණ්ඩ අංක 02 වශයෙන් [2016.11.03 දින සිට 2017.04.20 දින දක්වා] මම මෙම පළාත් සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, දෙල්ගොඩ, උඩුපිල උතුර, අංක 424/86/1, සෞම්‍ය සෙවන සුභ සාධක සමිතියේ සභාපති රවීන්ද්‍ර බොතේජු සහ ලේකම්, සමන්ත බොතේජු යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, හංවැල්ල, හිරිපොල, ගල්කැටිය, අංක 203/4 හි පදිංචි ආර්.ඒ.ඩී. ඇන්ඩෲ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, "*ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාට සහ විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, 2017.11.07 වන දින ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් අසන ලද අතුරු ප්‍රශ්නවලට පිළිතුරු සභාගත කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමිය සභා ගර්භයේ නැහැ. ඔබතුමා පිළිතුර සභාගත කරන්න.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***උඩංගාව ග්‍රාම සංවර්ධන සමිතියේ පසුබිම් වාර්තාව***

*මෙම සමිතිය මුල් වරට ලියාපදිංචි කර ඇත්තේ 1999.01.13 දිනය. පසුව මෙම සමිතිය ක්‍රියාකාරී නොවූ අතර නැවත සමිතියේ නිලධාරීන් පත් කර ලියාපදිංචි කරනු ලබන්නේ 2016.03.30 දිනය. ඒ අනුව ඉහත කාලය තුළ සමිති විසින් කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නැති බව දන්වමි. මෙම සමිතිය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත් වන්නේ 2016 න් පසුවයි. සමිතිය විසින් ගිණුමක් ආරම්භ කරනු ලබන්නේ 2016.03.31 දිනය.*

*උඩංගාව ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වලින් රු.462,963.36 ලාභාංශය වශයෙන් සමිති ගිණුමේ තබා ගෙන ඇත. මෙම මුදල කිසිදු කටයුත්තකට වියදම් නොකර ගිණුමේ පවත්වාගෙන ගොස් ඇත. එහෙත් 2017 වර්ෂයේදී සමිතියේ යෝජනා ස්ථිරත්වයකින් ගමෙහි සේවා පියසක් ගොඩ නැගීමට කටයුතු කර ඇත. ඒ අනුව පර්චස් 5 ක් මිලදී ගැනීමට රු.450,000/- ක සමිති අරමුදල් ලබා ගෙන ඇත.*

*එහෙත් සමිතිය වාර්ෂිකව මහා සභා රැස්වීම් පවත්වා නොමැති බැවින් හා අක්‍රීය තත්ත්වයෙන් පැවැති බැවින් වාර්ෂික වාර්තා පවත්වාගෙන ගොස් නොමැත.*

*මෙම ගිණුම් ශේෂය බැංකු පොතේ තොරතුරු පදනම් කරගෙන සකස් කරන ලද අයවැය වියදම් ලේඛනයක් බව කාරුණිකව සඳහන් කරමි.*

*මෙම සමිති 2016.01.01 දින සිට 2016.12.31 දිනට ගිණුමේ ශේෂය ඉදිරිපත් කරයි.*

*2016 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ශේෂය - 126,056.52*

***උඩංගාව ග්‍රාම සංවර්ධන සමිතිය - 2016 වර්ෂය ගිණුම් වාර්තාව***

***2016 වර්ෂය***

| ලැබීම් | | ගෙවීම් | |
|---|---|---|---|
| ඉතිරිය 2015 | 1500.00 | ව්‍යාපෘති ගෙවීම් | 7,568,970.00 |
| ව්‍යාපෘති ලැබීම් | 7,872,479.16 | ගෙවීම් 1 | 45,000.00 |
| සාමාජික මුදල් | 2700.00 | ගෙවීම් 2 | 140,000.00 |
| බැංකු පොළිය | 4047.67 | බැංකු ශේෂය | 126,756.87 |
| | **7,880,726.87** | | **7,880,726.87** |

***තිඹිරිගස්කටුව ග්‍රාම සංවර්ධන සමිතියේ පසුබිම් වාර්තාව***

*තිඹිරිගස්කටුව ග්‍රාම සංවර්ධන සමිතිය දැනට පත් වී ඇති නිලධාරීන් තනතුරු භාරගෙන ඇත්තේ 2014 වර්ෂයේදී බවත් ඒ වන විට මෙම සමිතිය සතුව බැංකු ගිණුමක් නොතිබූ අතර නව නිලධාරීන් තනතුරු භාර ගන්නා විට එතෙක් පවත්ව සිටි නිලධාරීන් සාමාජික මුදල් ලෙස රු.16,920/ ක මුදලක් නව භාණ්ඩාගාරික වෙත ලබා දී ඇත. ඒ අනුව, එතෙක් බැංකු ගිණුමක් ඔවුන් විසින් පවත්වාගෙනවිත් නොමැති අතර ගිණුමක් ආරම්භ කරනු ලබන්නේ නව නිලධාරීන් පත් වූ පසුව ය.*

*මෙම සමිතිය 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලසීමාවේදී ව්‍යාපෘති 13 ක් කර 5% රඳවාගෙන මුදලින් රු.792,969.73 ක් සමිතිය සතු කරගෙන ඇත. තවද හිටපු ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ විශ්‍රාම යාමත් සමගම ඔවුන් වෙත හරි මගපෙන්වීමක් කිරීමට නිලධාරියෙකු නොසිටි බැවින් 2017 වර්ෂයේ අමාත්‍යාංශ මගපෙන්වීම යටතේ සංවර්ධන ව්‍යාපෘති කීපයක් කිරීමට ඔවුන්ට හැකි විය.*

*උදාහරණ :*

1. *ඒවා එම සමිතියේ සාමාජිකත්වය ලබා සිටින තිඹිරිගස්කටුව වසමේ පදිංචි සුවිනීතා මහත්මියගේ නිවස සාදා ගැනීමට රු.44,800/- ක මුදලක් වැය කොට නිවසට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමට කටයුතු කර ඇත.*

2. *තිඹිරිගස්කටුව හරිස්චන්ද්‍ර පාසල 5 වසර 2017 ශිෂ්‍යත්වයට පෙනී සිටින ළමයි සඳහා රු.12,433/- ක මුදලක් යොදවා ශිෂ්‍යත්ව වැඩමුළුවක් කර ඇත.*

*එසේම තිඹිරිගස්කටුව ග්‍රාම සංවර්ධන සමිතිය 2018 වසර සඳහා නව වැඩ සටහන් කීපයක් ආරම්භ කිරීමට ඔවුන් සාකච්ඡා කර ඇති බව සමිතියේ ලේකම් විසින් මා වෙත දන්වා ඇත. ඒ අතර දිළිඳු පවුලක් සඳහා නිවසක් සාදා දීමට කටයුතු සූදානම් කර ඇත. මෙම සමිතියේ එක් එක් වර්ෂය අවසානයට අයත් ගිණුමෙහි ශේෂය ද මේ සමග දක්වමි.*

*මෙම සමිතිය ක්‍රියාකාරී තත්ත්වයෙන් පැවැතුණද වාර්ෂිකව මහා සභා රැස්වීම් පවත්වා නැති අතර කාරක සභා රැස්වීම් පමණක් පවත්වාගෙන ගොස් ඇත. එහෙත් බැංකු ගිණුම් සමඟ සැසැඳීම් කර සකස් කරන ලද වියදම් වාර්තාව මේ සමග ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.*

*2016 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ශේෂය - 387,574.83*
*2015 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ශේෂය - 336,762.23*
*2014 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ශේෂය - 145,420.30*
*2013 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ශේෂය - 16,920.00*

*(බැංකු ගිණුමක් නැත.)*

### *2014*

| | *ලැබීම්* | | *ගෙවීම්* |
|---|---|---|---|
| *පසුගිය නිලධාරීන්ගෙන් ලැබීම්* | *16,920.00* | *බිල් 1 -9* | *5,006.00* |
| *සාමාජික මුදල්* | *21,400.00* | *ව්‍යාපෘති ගෙවීම්* | *2,469,797.82* |
| *ව්‍යාපෘති ලැබීම්* | *2,580,397.66* | *අත ඉතිරිය* | *814.00* |
| *බැංකු පොළිය* | *2,320.46* | *බැංකු ශේෂය* | *145,420.30* |
| | ***2,621,038.12*** | | ***2,621,038.12*** |

### *2015*

| | | | |
|---|---|---|---|
| *2014 අත ඉතිරිය* | *814.00* | *බිල් 10* | *350.00* |
| *2014 බැංකු ශේෂය* | *145,420.30* | *ව්‍යාපෘති ගෙවීම්* | *3,259,700.00* |
| *ව්‍යාපෘති ලැබීම්* | *3,879,564.80* | *අත ඉතිරිය* | *464.00* |
| *බැංකු පොළිය* | *9,096.18* | *බැංකු ශේෂය* | *774,381.28* |
| | ***4,034,895.28*** | | ***4,034,895.28*** |

### *2016*

| | | | |
|---|---|---|---|
| *අත ඉතිරිය 2015* | *464.00* | *බිල් 11, 26, 34, 35, 36, 37, 38* | *4,036.84* |
| *බැංකු ශේෂය 2015* | *774,381.28* | *ව්‍යාපෘති ගෙවීම්* | *4,762,671.00* |
| *සාමාජික මුදල්* | *200.00* | *බැංකු ශේෂය* | *387,574.83* |
| *ව්‍යාපෘති ලැබීම්* | *3,984,223.50* | | |
| *බැංකු පොළිය* | *2,0841.05* | | |
| *බැංකුවෙන් ගත්තා* | *2000.00* | | |
| | ***4,782,109.83*** | | ***5,154,282.67*** |

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ඒ වාගේම 2017.11.07 දින රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද අතුරු ප්‍රශ්නවලට පිළිතුරු සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

***සී/ස මීගමුව සමිතියේ සභාපති, එම බල ප්‍රදේශය තුළ මහා පරිමාණ ඉන්ධන පිරවුම්හලක් හා හාඩ්වෙයාර් ආයතනයක හිමිකරුවෙකු බවට ඇති පැමිණිල්ල පිළිබඳව :***

***පිළිතුර :***

*1973 සමුපකාර රීති මාලාවේ 21(ඌ) වගන්ති අනුව මහ සභාවේ අදහස පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළඳාමක හෝ වෙනත් කටයුත්තක තමන්ගේම හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ යෙදී සිටින කෙනෙක් කාරක සභිකත්වයට නුසුදුසු වන්නේ ය.*

*ප්‍රශ්නයට අදාළ ඉන්ධන අලෙවි සැලක් පවත්වාගෙන යනු ලබන්නේ සී/ස මීගමුව සමිතියේ වර්තමාන සභාපති බී. සුරංග ලක්මාල් ප්‍රනාන්දු මහතාගේ නමින් නොව ඔහුගේ බිරිඳගේ නමින් බව පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.*

*මෙම ඉන්ධනහල සමිතියේ දියුණුවට බාධාවන බවට තීරණය කළයුතු වන්නේ සමිතියේ මහ සභාව විසින් වන අතර, එලෙස මහ සභාව තීරණය කළ පසු පමණක් ඉදිරි කටයුතු කිරීමට සමුපකාර කොමසාරිස්වරයාට හැකි ය.*

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට, අපි ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයක් පසු කරමින් යන්නේ. විශේෂයෙන් මම මේ සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ, අපි දීර්ඝ කාලයක් මේ පළාත් සභාවේ භෞතික සංවර්ධනය කෙසේ වෙතත් ගුණාත්මක සංවර්ධනය පැත්තෙන් අපි පසුගිය කාලයේ ඉදිරි පියවරයන් රාශියක් තැබුවා. විශේෂයෙන් ද්විඝ මාධ්‍ය ගුරුවරු සම්බන්ධව දීර්ඝ කාලීන හිඟයක් තිබුණා. මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා, අපේ ගරු ආණ්ඩුකාරතුමාට. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපි පියවරයන් දෙකක් ඉස්සරහාට තියලා තිබුණා. ද්විඝ මාධ්‍ය ගුරුවරු සම්බන්ධව තිබෙන හිඟය කෙතරම්ද කියනවා නම්, හුඟාක් පාසල්වල අධ්‍යාපන

කටයුතු කර ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ද්‍රවිඩ මාධ්‍ය පාසල් 72 ක් අප සතුව තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ද්‍රවිඩ මාධ්‍ය ගුරුවරු බඳවා ගැනීමේ පියවරයන් දෙකක් තිබ්බා. එකක්, එක් එක් විෂයයන් සම්බන්ධව පොදුවේ බඳවා ගැනීමක් කළා.

දැන් දෙවැනි කාරණාව. වතු පාසල් සඳහා ද්‍රවිඩ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙළ. ඒ නිසා මම හිතනවා, මේ දවස්වල අපි ඉතාම හොඳින් වග විභාග කරගෙන, සාකච්ඡා කරගෙන යනවා. අපි මේ සැරේ අයවැය ලේඛනයේදී ප්‍රමුඛතාවය දෙන්නේ මගේ අමාත්‍යාංශයේ ගුණාත්මක පැත්ත සම්බන්ධයෙන්. මොකද, භෞතික වශයෙන් බොහෝ දේවල් පාසල්වල තිබුණත්, දරුවන්ගේ අධ්‍යාපනික කටයුතුවල බිඳ වැටීමක් තිබෙනවා. නිවැරැදි විදුහල්පතිවරුන් පත් කිරීම, නිවැරැදි ගුරුමාරු ක්‍රමයක්, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිවැරැදි කිරීම් සහ ප්‍රතිඵල ඉහළ නැංවීමේ විශේෂ ව්‍යාපෘති රාශියක් අපි ක්‍රියාත්මක කරමින් යනවා. ඒ නිසාවෙන්, ඒ සඳහා විශේෂිත වැඩ පිළිවෙළක් මම ක්‍රියාත්මක කරමින් තිබෙනවා. අපේ උපදේශක කාරක සභාවේ සහයෝගය අපට ලැබිලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ. එන අවුරුද්දේ අපේ බලාපොරොත්තුව - දැනට පළාත් 09 න් අපට මතු පිටින් පෙනෙන ප්‍රතිඵලය අපි දෙවැනියා බවයි. මම මේ සඳහා හොඳ විග්‍රහයක යෙදුණා. ඒ විග්‍රහය තුළ බැලුවාම මට දැනුණු කාරණා දෙකක් තිබුණා. භාෂා සහ ගණිතය විෂයය සම්බන්ධව තිබෙන දුර්වලතාවය. මම තව විග්‍රහයක යෙදෙමින් බැලුවා.

ගරු සභාපතිතුමනි, මේ විග්‍රහයන් තමන්ගේ පැත්තට ගලපාගෙන තිබෙන්නේ. ඒ නිසා අද මම විශේෂයෙන් සඳහන් කරන්නේ අපි දෙවැනියා වූ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිඵලය එන අවුරුද්ද තුළ පළමුවැනි තැනට කරන්න ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ කිහිපයක් ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂ ව්‍යාපෘති ගොඩනඟන්න බලාපොරොත්තු වෙනවා. ගුරුවරුන් අලුතින් බඳවා ගන්න බලාපොරොත්තු වෙනවා. ගුරු පුහුණු, විදුහල්පති පුහුණු, ප්‍රතිඵල නංවාලීම සඳහා දරුවන් හඳුනාගෙන, විශේෂ කාරණා රාශියක් දැනටමත් අපි සකස් කරගෙන තිබෙනවා. මේ ගරු සභාවේ අද ලැබුණු අවස්ථාවක් හැටියට මම මේක සඳහන් කරන්න හේතුව මේ අවුරුද්දේ අද 2018 නව අයවැය ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙතින් සුභ මොහොතින් ඉදිරිපත් කරන මොහොතේ ඒ සඳහා ගරු සභාපතිතුමා, අපේ ගරු ඇමැතිතුමන්ලා, ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම බලාපොරොත්තු අපේක්ෂා පෙරදැරිව නව අවුරුද්දේ හොඳ යහපත් සංවර්ධිත අයවැයක් අපේක්ෂාවෙන් ඉන්න බව මතක් කරමින් ගරු මහ ඇමැතිතුමාට සුභ පතමින් මම නිහඬ වෙනවා.

## පළාත් සභාවේ රැස්වීම
## PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්යය පටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් නොවිය යුතුය"*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා, අයවැය කථාව පවත්වමින් 2018 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කරන ලෙසට. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා.

සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් මම එතුමාව ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නවා. අද ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මුදල් ප්‍රකාශය ඉදිරිපත් කර අයවැය කථාව පවත්වා, විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම. දෙක, "2018 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය" යන යෝජනාව ඉදිරිපත් කිරීම. තුන, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් "2018 මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය" යන යෝජනාව ඉදිරිපත් කිරීම.

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2018 වසර
## ANNUAL FINANCIAL STATMENT - 2018

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

*ගරු සභාපතිතුමනි, "2017 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා, මුදල් ප්‍රකාශය සහ විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කරන ලෙසට.

# අයවැය කථාව- 2018 වසර
## BUDGET SPEECH – YEAR 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අද දින ඉතාමත්ම ඓතිහාසික දිනයක්. 1988 ජූනි 02 වැනිදා අපේ පළාත්වල මැතිවරණය පවත්වලා, 1988 ජූනි මාසේ 22 වැනිදා තමයි බස්නාහිර පළාත් සභාව පිහිටුවලා තිබෙන්නේ. ඒ අනුව මම විසින් මේ සභාවට ඉදිරිපත් කරන තුන් වැනි අයවැය වන අතර, බස්නාහිර පළාත් සභාව ඉදිරිපත් කරන 30 වැනි අයවැය කියලා තමයි කියන්නේ. විශේෂයෙන්ම මොකද පළාත් සභාවක් පිහිටුවලා, මේ වන විට අවුරුදු 30 ක් වෙනවා. ඒ නිසා මේක ඉතාමත් වැදගත් අවස්ථාවක්. ඒ වාගේම අපි විශේෂයෙන්ම පළාත් සභා ඉතිහාසය තුළ විශාල මුදල් ප්‍රමාණයක්, බිලියන 10 කින් - සම්පූර්ණයෙන්ම ගොඩනැගිලි අනිකුත් කාරණා එක්ක බලනකොට බිලියන 10 ක් අපි මේ සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙනවා. එයිනුත් බිලියන 05 ක් අපට සෘජුව පළාතේ - අපේ අමාත්‍යාංශය යටතේ පළාතේ ජනතාවට සේවය කරන්න බිලියන 05 ක මුදලක් මේ අයවැයෙන් වෙන් වෙනවා. ඉතින් මම හිතනවා, මේ පළාත් සභා ඉතිහාසය ගත්තාම අපි දන්නවා, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. 1988 සිට, මම හිතන්නේ 1988 මුළු සභා කාලයම නියෝජනය කරපු මන්ත්‍රීවරු අද මේ සභාවේ නැහැ. මේ සභාවේ ඉන්නේ, ඔක්කොම 1993 න් 94 න් පස්සේ ආව අයයි. ඒ අනුව පළමුවෙන්ම අපි කථා කළොත් එහෙම මේ පළාත් සභාව පිහිටුවලා මන්ත්‍රීවරයෙක්ට - මම හිතන්නේ මේ පළාත් සභාව පිහිටුවලා මන්ත්‍රීවයෙක්ට 1988 කාලයේ විතර ලැබුණේ ලක්ෂ 15 ක විතර මුදලක්. නේද? ලක්ෂ 15 ක විතර මුදලක් තමයි මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වශයෙන් ලැබුණේ. ඊට පස්සේ සුසිල් ප්‍රේමජයන්ත ඇමැතිතුමාගේ කාලයේ තමයි ලක්ෂ 25 ක් වෙලා තිබෙන්නේ. ඊට පස්සේ ඒක දිගටම ඒ මුදල රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමා දක්වා ඇවිල්ලා, ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමැතිතුමාගේ කාලයේ ලක්ෂ 35 ක් වෙලා තිබෙනවා. එයිනුත් ලක්ෂ 35 ක් සියලුම මන්ත්‍රීවරුන්ට ලැබුණත් ලක්ෂ 15 ක් තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලැබුණේ. නමුත් දැන් මම 2015 මහ ඇමැතිවරයා හැටියට පත් වුණු දවසේ ඉඳන්, අපි රජයෙන් ලැබුණු මුදලට අමතරව ලක්ෂ 25 ක මුදලක් සෑම මන්ත්‍රීවරයෙකුටම - මේ පළාත් සභාව නියෝජනය කරන සෑම මන්ත්‍රීවරයෙකුටම අපි ලබා දීලා තිබෙනවා. පාලක පක්ෂයේ වාගේම විපක්ෂයේත්. මොකද, මේ සැරෙත් උපමාන පාදක යටතේ රජයෙනුත් එවලා තිබෙන්නේ, ලක්ෂ විසි හතරයි දශම ගණනක් තමයි, මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන හැටියට. මම මහ ඇමැති හැටියට පත් වුණු වෙලේ සිටම, අපි ලක්ෂ 26 ක මුදලක් හැම වර්ෂයකම මට වෙන් වෙන, මගේ මුදල් ඇමතිවරයා හැටියට මට වෙන් වෙන මුදලින් අපි තමුන්නාන්සේලාට ලක්ෂ 25 යි දශම ගණනක මුදලක්, ලක්ෂ 26 ක පමණ මුදලක් සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන් නියෝජනය වන ආකාරයෙන් ලබා දීලා තිබෙනවා.

එතකොට ඒ අනුව කල්පනා කරලා බැලුවාම මේක එක කොටසකටද, එක ආසනයකටද, දිස්ත්‍රික්කයකට ද කියලා නැහැ. දැන් පසුගිය සභාවල එම කාරණාව මතු වුණා. දැන් මම දැක්කා, මේ පරිපූරකය - අපි පසුගියදා ඉදිරිපත් කරපු පරිපූරකය සම්බන්ධයෙන් සමහරක් මන්ත්‍රීවරු හිතාමතා හෝ නැත්නම් නොදැනුවත්කම නිසා විවිධ අදහස් ප්‍රකාශ කරනවා. ඒ අනුව පරිපූරක අයවැයෙන් සම්පූර්ණයෙන් රුපියල් මිලියන 1200 ක් අපි සංවර්ධනය සඳහා වෙන් කළා. එයින් 519 ක්

ප්‍රධාන අමාත්‍යාංශයටත්, ඉතුරු ටික අපේ පළාත් පාලනයටත් රුපියල් මිලියන 300 ක්, කෘෂිකර්මයට රුපියල් මිලියන 97.7 ක්, මාර්ගවලට රුපියල් මිලියන 100 ක්, ඒ වාගේම අධ්‍යාපනයට රුපියල් මිලියන 99.22 ක් අපි වෙන් කළා. එතකොට ප්‍රධාන අමාත්‍යාංශයට වෙන් කරපු මුදලින් මේ වන කොට අපි පළාත් සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 20 ගණනේ ප්‍රතිපාදනයක් වෙන් කළා. ඒ අනුව අපි රුපියල් මිලියන 208 ක් - ඒ මිලියන 519 න් මිලියන 208 ක් අපි තමුන්නාන්සේලාට, මන්ත්‍රීවරු 104 දෙනාටම පරිපූරකයෙන් රුපියල් මිලියන දෙක බැගින් මේ වන කොට අපි ලබා දීලා තිබෙනවා. එයිනුත් අපි රුපියල් මිලියන 54 ක් වෙන් කළා. පසුගියදා ගංවතුර නිසා හානි වූ වැසිකිළි, කැසිකිළි හදන්න අපි රුපියල් මිලියන 54 ක් වෙන් කළා. ඒ වාගේම පාසල් ගොඩනැඟිලිවලට අපි ඒ මිලියන 519 න් 127 ක් දීලා තිබෙනවා. ඒ වාගේම PRDA එකටයි, රෝහල්වලටයි කටයුතු කරන්න රුපියල් මිලියන 100 ක් විතර දීලා තිබෙනවා. ඉතිරි මුදල් අපි බෙදා හැරලා තිබෙන්නේ, ඒ එක් ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාවයන් අනුව. ඒ අනුව මේ රුපියල් මිලියන 1200 අපි මේ වන කොට ඉතිරි රුපියල් මිලියන ප්‍රමාණය අපි ඒ අමාත්‍යාංශවලට වෙන් කරලා තිබෙනවා. දැන් අපි කඩිනමින් මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගෙන යනවා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, වෙනස් වීම් කරන්නේ නැතිව, ව්‍යාපෘති මාරු කරන්නේ නැතිව කඩිනමින් දෙසැම්බර් 31 ට පෙර තමුන්නාන්සේලාට වෙන් වෙලා තිබෙන ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම වියදම් කරලා ඉහළ ප්‍රගතියක් ළඟා කර ගන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තවත් දෙයක් මේ සභාවේ කථා වුණා. මේ දිස්ත්‍රික්කවලට බෙදී යන ආකාරය පිළිබඳව. මගේ ළඟ තිබෙනවා ගරු සභාපතිතුමනි, ප්‍රධාන ලේකම් කාර්යාලය නිකුත් කරන 109 වැය ශීර්ෂය. මේකේ තිබෙනවා, සමස්ත 2014 – 2017 ප්‍රගතිය. මම මේක කෙටියෙන් කියන්න කැමැතියි. මොකද, ඇතැම් අය මේ සභාවේ මන්ත්‍රීවරු නොමග යවන්න දරන උත්සාහය නිසා. මම ඒ ටික ඔක්කොම ගෙනාවා. එහෙම බැලුවොත් 2016 ප්‍රගතිය. 2014 කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 2473 ක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයට. 2014 දී. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයට ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙනවා, 2731 ක්. එතකොට කළුතර ව්‍යාපෘති 1767 කට ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. මේ 2014 දී. හිටපු මහ ඇමතිතුමාගේ කාලයේ. එතකොට 2015 දී අපි කොළඹට ක්‍රියාත්මක කරලා තිබෙනවා ව්‍යාපෘති 2505 ක්. ගම්පහට 2983 ක්. කළුතරට 2061 ක්. එහෙම බැලුවත් අපි ඉන්න දිස්ත්‍රික්කයේ නොවෙයි, ව්‍යාපෘති බහුතරයක් ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයට. ඒ වාගේම 2016 ගත්තොත් කොළඹට 2792 ක්. ගම්පහට 3089 ක්. එතකොට කළුතරට 2351 ක්. එතකොට 2017 තවම අපි අවසාන එකක් අරගෙන නැහැ. නමුත් දැනට අරගෙන තිබෙන විධියට අපේ නිලධාරීන් කියන්නේ, 2017 දීත් අපි ගත්තොත් එහෙම ගම්පහට තමයි ව්‍යාපෘති ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මම එක් එක් මැතිවරණ බල ප්‍රදේශයන් ගත්තා. මේකේ අඩු වැඩිවීම් වෙලා තිබෙන්නේ, මේ මනාප ක්‍රමය අනුව බහුතරයක් මන්ත්‍රීවරු නියෝජනය වන කොට්ඨාශවලට ප්‍රතිපාදන වෙන් කිරීමේදී වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මන්ත්‍රීවරු බහුතරයක් නියෝජනය වෙනවා, ඒ කොට්ඨාශවලට. ඒක වැරැද්දක් නොවෙයි. මේ මනාප ක්‍රමයේ අපි දකින වැරදි පැත්තත් ඒකයි. එහෙම නැතිව කාටවත් පුද්ගලිකව වෙන දෙයක් නැහැ.

ගරු සභාපතිතුමනි, මහ ඇමතිවරයා හැටියට මම පත් වෙලා, මුදල් ඇමති වෙලා මම ටිකක් වැඩිපුර දා ගන්න ඕනෑ නේ? මහරගමට. හැබැයි, එහෙම දැම්මත් මම ඒකත් කියන්නම්. හැබැයි, එහෙම අපට ආර්ථික වටිනාකමක් තිබුණත්, එහෙම බැලුවත් අපි ප්‍රස්තාර අනුව ගත්තාම, ව්‍යාපෘති අනුව ගත්තාම කොළඹ දිස්ත්‍රික්කයේ 2017 ව්‍යාපෘති අනුව බැලුවොත්, කොළඹ මහ නගර සභා සීමාව තුළ ව්‍යාපෘති 104 ක්, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ ව්‍යාපෘති 239 ක්. හෝමාගම අපේ ඇමතිතුමාගේ කොට්ටාශයේ ව්‍යාපෘති 200 ක්. කැස්බෑව ව්‍යාපෘති 171 ක්. එහෙම බැලුවත්, ව්‍යාපෘති අනුව බැලුවත්, මහරගම බැලුවත් අපට 140 යි. එහිදී කාටවත් මොකුත් කියන්න බැහැ. මොකද, මීට පෙර කිසිම පළාත් සභාවක මන්ත්‍රීවරුන්ට බෙදී යන මුදල සමානතාවයක් ඇති වුණේ නැහැ. ඒ නිසා දේශපාලන වශයෙන් ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් ඍජුව කියන්න බැහැ, මොකද, මම හැම වෙලාවේම ප්‍රවේසම් වුණා මහජනයාගේ ඉල්ලීමට අනුව මේ දිස්ත්‍රික්ක තුනටම මුදල් බෙදී යන ආකාරයට කටයුතු කරන්න. අපි මහජන මන්ත්‍රීවරු ගත්තොත් සමහර අය ව්‍යාපෘති යෝජනා හදලා. මන්ත්‍රීවරු බොහොම කැමැතියි, සමහර මන්ත්‍රීවරු ඉන්නවා ගම්වලට වැඩක් කරන්න. ඒ වාගේ උනන්දුවක් දක්වන මන්ත්‍රීවරු ඉන්නවා. අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාව උදාහරණයකට ගත්තොත්. එතුමා සාමාන්‍යයෙන් එතුමාගේ ප්‍රදේශයේ යෝජනා ඉදිරිපත් කරන කොට, එතුමා

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

පොතක් හදලා, ඒ ව්‍යාපෘති වාර්තාවක් හදලා තමයි යෝජනා ඉදිරිපත් කරන්නේ. එතකොට ඒ වාගේ - (බාධා කිරීමක්) අධ්‍යාපන ඇමතිතුමාද? ඒ වාගේ උනන්දුවක් දක්වන මන්ත්‍රීවරු තමන්ගේ යෝජනා ඉදිරිපත් කරමින්, අපෙන් ඉල්ලීමක් කළාම අපි දීලා තිබෙනවා. මේ සභාවේ ඉන්න පාලක පක්ෂයේ එක්කෙනාද? විපක්ෂයේ එක්කෙනාද කියලා නැහැ. මම හිතන්නේ, තමුන්නාන්සේලා ඔක්කොම දන්නවා. තමුන්නාන්සේලා මොකක් හරි ප්‍රායෝගික, ජනතාවට වැදගත්කමක් තිබෙන සංවර්ධන යෝජනාවක් මා වෙත ඉදිරිපත් කළොත්, මම ඒකේ බලන්නේ දේශපාලන පක්ෂය නොවෙයි. ඒකේ මම බලන්නේ පළාතේ ජනතාවට වන ප්‍රතිලාභ යයි. ඒ අනුව මම මුදල් වෙන් කරලා තිබෙනවා. මොකද, මම හැම වෙලාවකම ආසාවෙන් ඉන්නවා. පළාතේ ජනතාවට මේ මුදල්වලින් සාධාරණයක් වෙන්න ඕනෑය කියන මතයේ ඉඳගෙන මම කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා කාටවත් එහෙම චෝදනා කරන්න බැහැ. අපි පක්ෂ නායක රැස්වීමේදීත් සාකච්ඡා කළා. ඒ අනුව අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් යෝජනා තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳවත් අපේ අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු මන්ත්‍රීවරුනි, අතීත අයවැය දෙකක් ඉදිරිපත් කර ඒවායේ ප්‍රතිඵල ද සමග මෙය මා විසින් මෙම සභාවට ඉදිරිපත් කරන තෙවන අයවැය යි. ඒ සමගම 2018 වර්ෂයට අදාළ කෙටුම්පත් මුදල් ප්‍රකාශය සහ විසර්ජන ප්‍රඥප්තිය ද ඔබතුමන්ලා හමුවේ තැබීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, අතීතයේ මෙම රට තුළ කිසිදාක නොතිබූ ප්‍රජාතන්ත්‍රවාදී, මිනිස් නිදහස අගයන සමාජ වාතාවරණයක් වර්තමානයේ පවතිනවා. මිනිසාට ආදරය කරන, මිනිසාට ගෞරව කරන, ග්‍රාමීය ජන තලයෙන් බිහිවූ නායකයෙකු රට පාලනය කිරීම එයට ප්‍රධාන හේතුවයි. නිරන්තර වැඩ වර්ජන, කඩාකප්පල්කාරී උද්ඝෝෂණ කෙතරම් පැවතියත් ඒවාට ද ගරු කරමින් මිනිස් සමාජයේ ආකල්පමය වෙනසක් සිදුකරමින්, උසස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තලයකට රට මෙහෙයවීම අතිගරු ජනාධිපතිතුමාගේ මූලික දර්ශනය යි. එම දර්ශනයට අනුගත වෙමින්, ඒ වූ ආකාරයට මෙම පළාත මෙහෙයවීමේදී පක්ෂ, විපක්ෂ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ලැබෙන සහයෝගය මා ඉතා අගය කරනවා. මෙම අයවැය ඉදිරිපත් කරමින්, ඉදිරියට ද සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් එම සහයෝගය මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ අහිතකර බලපෑම මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේදී සියයට 5 ක පමණ මධ්‍යස්ථ අනුපාතයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර ඉන් පසුව ආර්ථික වර්ධන වේගය ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි ද, 2020 වන විට සියයට 7 ක වාර්ෂික වර්ධන වේගයක් වාර්තා කරනු ඇතැයි ද අපේක්ෂා කරනවා.

කෙසේ වුවත් 1990 දශකයේ දී දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 20 ක් පමණ පැවති රජයේ ආදායම 2014 අග වන විට සියයට 11.5 දක්වා පහත වැටී තිබීම රජය මුහුණ දී ඇති ප්‍රබල අභියෝගයක්. ආදායම් තත්ත්වය එසේ පැවතියත් රජයේ වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20.9 ක් පමණ මට්ටමක පැවතීම තවත් අභියෝගයක්. නමුත් අපට ආසන්න ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, තායිලන්තය, පිලිපීනය වැනි රටවල මෙම තත්ත්වයන් නැහැ. තායිලන්තයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 22.6 ක් වන විට වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 22.3 යි.

1990 අග වන විට සියයට 48.4 ක් ව පැවති "*ණය සේවාකරණ ගෙවීම්*" අනුපාතය ද 2014 අග වන විට සියයට 96.8 දක්වා වැඩි වී තිබුණා. නමුත් 2016 අග වනවිට මෙම අනුපාතය ද සියයට 80.2 දක්වා අඩුකර ගැනීමට හැකි වී තිබෙනවා. 2016 වසරේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ණය සියයට 79.3 ක්. එය 2001 – 2004 කාලපරිච්ඡේදයට වඩා අඩු අගයක් වුවත් කලාපයේ අනෙකුත් රටවල් හා සැසඳීමේදී මෙය ඉතා ඉහළ අගයක්. ඉන්දුනීසියාවේ මෙය සියයට 27 යි. පිලිපීනයේ සියයට 37 යි. තායිලන්තයේ සියයට 43 යි. විශාල රාජ්‍යයක් වන ඉන්දියාවේත් මෙය සියයට 67 යි.

ගරු සභාපතිතුමනි, කුමන බාධා මධ්‍යයේ වුවද 2020 වන විට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 16.5 දක්වා වර්ධනය කර ගැනීම සහ රජයේ වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14.8 ක මට්ටමක පවත්වා ගැනීම අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයේ අරමුණයි. රටේ යහපත වෙනුවෙන් මෙම ඉලක්ක ඉටුකර ගැනීම සඳහා උපරිම වශයෙන් සහාය ලබා දීම අප පළාත් සභාවේද යුතුකමක් සහ වගකීමක් වෙනවා.

ගරු සභාපතිතුමනි, සංවර්ධනයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය වර්ෂය අගභාගය කරා තල්ලු වී තිබීම අඩු කර ගැනීම සඳහාත්, සංවර්ධනය වර්ෂය පුරා ඒකාකාරීව පවත්වා ගැනීම සඳහාත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ ද අදහස් සැලකිල්ලට ගෙන මෙම වර්ෂයේ අපි සාධනීය පියවරයන් රාශියක් ගත්තා. ව්‍යාපෘති අනුමත කිරීමේ බලය අදාළ අමාත්‍යාංශ වෙත පැවරීම එක් සාධනීය පියවරක්. එම පියවරේ යහපත් ප්‍රතිඵල තිබෙනවා. මේ සමග ඉදිරිපත් කරන පළමුවන උපලේඛනය මගින් එය පෙන්නුම් කරනවා. 2014, 2015 සහ 2016 යන වර්ෂ තුනේම ඔක්තෝබර් අග වන විට ව්‍යාපෘති අනුමැතිය පිළිවෙලින් සියයට 53 ක්, සියයට 67 ක්, සහ සියයට 69 ක්. නමුත් 2017 වර්ෂය ඔක්තෝබර් අග වන විට ව්‍යාපෘති අනුමැතිය සියයට 88 ක්. එය අප ගත් පියවරයන්හි හොඳ ප්‍රතිඵලයක්. නමුත් ව්‍යාපෘති සංශෝධනයන් අඩු කර ගැනීම සම්බන්ධයෙන් අප තවමත් හොඳ තත්ත්වයකට ළඟා වී නැහැ. මේ සමග ඉදිරිපත් කරන දෙවන උපලේඛනය මගින් ගරු මන්ත්‍රීතුමන්ලාට මෙය දැක ගන්න පුළුවන්. 2014 වර්ෂයේ එය සියයට 28 යි. 2016 වන විට එය සියයට 31 දක්වා වැඩි වෙලා. 2017 වර්ෂයේ අගෝස්තු වන විට එය සියයට 8 ක් වුවත් වැඩි ව්‍යාපෘති සංඛ්‍යාවක් සංශෝධනය වන්නේ වර්ෂය අග භාගයේ නිසා පෙර වර්ෂවල මට්ටමට එය ළඟා නොවේ යැයි කියන්න පුළුවන් කමක් නැහැ. සංශෝධනයක් තිබිය හැකි වුවත්, එය නිසි වේලාවේදී සිදු නොකිරීමත්, නිතර නිතර සංශෝධනය කිරීමත් නිසා ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන ඉතිරි වෙන්න පුළුවන්. එම නිසා අප කාගේත් අවධානය මේ කෙරෙහි යොමුකර සංශෝධනයන් අඩු කර ගැනීමට කටයුතු කළ යුතු වෙනවා. ව්‍යාපෘති කල් වේලා ඇතුව නිවැරදිව හඳුනා ගතහොත් සංශෝධන අඩු කර ගැනීම ගැටළුවක් වන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, 2018 වර්ෂයේ මුදල් ප්‍රකාශයේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 71,645 ක් - බිලියනවලින් ගත්තොත් බිලියන 71 යි. මිලියන 645 ක් වන අතර එය පෙර වර්ෂයට වඩා රුපියල් මිලියන 10,369 ක, එනම් සියයට 16.9 ක වැඩිවීමක්. ඒ අනුව අපි පළාත් සභා ඉතිහාසය තුළ වැඩිම ප්‍රතිපාදනයක් පළාතේ සංවර්ධනය සඳහා වියදම් කරන වර්ෂය 2018 වර්ෂය බව මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. ඉන් රුපියල් මිලියන 59,995 ක් පුනරාවර්තන වියදම් වන අතර රුපියල් මිලියන 11,650 ක් ප්‍රාග්ධන වියදම්ය. මෙම වියදම් පියවා ගැනීම සඳහා රජයෙන් ලැබෙන ජාතිය ගොඩනැගීමේ බදු - NBT සහ මුද්දර ගාස්තුව රුපියල් මිලියන 26,400 ක්. රජයේ ප්‍රදාන වශයෙන් රුපියල් මිලියන 20,229 ක් ලැබෙනවා. පළාත් සභා රැස් කිරීමට බලාපොරොත්තු වන ආදායම රුපියල් මිලියන 25,016 ක්. පුනරාවර්තන වියදම්, ආදායම් සහ අපේක්ෂිත ප්‍රදාන පිළිබඳ විස්තර පිළිවෙලින් තුන් වන, හතර වන සහ පස් වන උපලේඛන වශයෙන් මේ සමග ඉදිරිපත් කරනවා.

**ප්‍රාග්ධන වියදම්**

ගරු සභාපතිතුමනි, 2018 වර්ෂයේ අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 11,650 ක් වෙනවා. එය වර්ෂයේ දැරීමට අපේක්ෂිත මුළු වියදමින් සියයට 16.2 ක්. 2017 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,019 ක් ලබා දුන් අතර 2018 වර්ෂය සඳහා මේ යටතේ ලබා දීමට එකඟ වී ඇති මුදල රුපියල් මිලියන 1,560 ක්. දැන් රජයෙන් සියලුම අමාත්‍යාංශවලටත්, අනිකුත් සියලුම වියදම් සඳහා අපට ලැබෙන්නේ, 1560 ක්. නමුත් ඒකට අපි අපේ ආදායමෙන් මේ සැරේ එකතු කරලා තිබෙනවා, තමුන්නාන්සේලාගේ ප්‍රතිපාදන සඳහා රුපියල් මිලියන 3000 ක්. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පසුගිය වර්ෂ කිහිපය තුළ මුදල් කොමිෂන් සභාව විසින් ලබා දුන් ප්‍රතිපාදන එක් එක් විෂයයන් වශයෙන් හය වන උපලේඛනයෙහි දක්වනවා. පුළුල් පරාසයක පවතින සමහර විෂයයන් සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. මුදල් කොමිෂන් සභාවේ අවධානය මේ කෙරෙහි යොමු විය යුතුයි. එම නිසා ලබා දෙනු ලබන ප්‍රතිපාදන වැඩි කරන ලෙසත්, විෂයයන්හි කළ යුතු කාර්යභාරය අනුව ප්‍රතිපාදන සලසන ලෙසත් මුදල් කොමිෂන් සභාවෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම හිතන විධියට, මෙය ගණනය කළොත් - සාමාන්‍යයෙන් අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුට රජයෙන් ලැබෙන ලක්ෂ 24 ත්, අපෙන් ලැබෙන ලක්ෂ 25 ත්, ඊළඟට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබෙන ප්‍රතිපාදන සහ ඒ වර්ෂය මුළුල්ලේ මාගෙන් කරන ඉල්ලීම් අනුව කල්පනා කරලා බැලුවොත් බොහෝ විට අපේ ගරු මන්ත්‍රීවරු ලක්ෂ 100 කට ආසන්න මුදලක් හෝ ඊට වැඩි මුදලක් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා පාවිච්චි කරලා තිබෙනවා.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ගරු සභාපතිතුමනි, කෙසේ වුවත් පළාත් සභා ආදායම්වලින් පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පසුගිය වර්ෂ තුන තුළ පරිපූරක ප්‍රතිපාදන ද ඇතුළුව රුපියල් මිලියන 6,924 ක් සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කර තිබෙනවා. 2018 වර්ෂය සඳහා මේ යටතේ රුපියල් මිලියන 3,000 ක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරනවා. එය පසුගිය වර්ෂය ආරම්භයේ වෙන් කළ මුදලට වඩා සියයට 26 ක වැඩිවීමක්.

**ආදායම් ප්‍රවර්ධනය**

ගරු සභාපතිතුමනි, අප කෙතරම් උත්සාහ කළත් පළාත් සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රජයෙන් වෙන් කර දෙන්නේ නැහැ. වර්තමානයේ පමණක් නොවෙයි දීර්ඝ කාලයක් තිස්සේ පැවති තත්ත්වය එයයි. 2016 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 7,412 ක් ඉල්ලුම් කළත්, ලබා දුන්නේ රුපියල් මිලියන 2,894 යි. 2017 වර්ෂයේ ඉල්ලුම් කළ මුදල රුපියල් මිලියන 7,076 ක් වුවත් ලබා දුන්නේ රුපියල් මිලියන 764 ක් පමණයි. එම නිසා පළාත් සංවර්ධනය සඳහා පළාත් ආදායම් වැඩි කර ගැනීම පිළිබඳ අපගේ විශේෂ අවධානය යොමු කර ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සමන්විත ආදායම් ප්‍රවර්ධන කමිටුවක් පත් කර තිබෙනවා. එතුමන්ලා නව ආදායම් මාර්ග හඳුනා ගැනීමටත්, හිඟ ආදායම් එකතු කිරීමටත් විශාල පරිශ්‍රමයක් දරමින් කටයුතු කරනවා. නව ආදායම් මාර්ගවල නීතිමය හැකියාව අධ්‍යයනය කරමින් ඒවා ක්‍රියාත්මක කර වීම පිළිබඳ රජයේ අමාත්‍යාංශ සහ භාණ්ඩාගාරය සමග සාකච්ඡා පවත්වනවා. එම කමිටුව කරනු ලබන කාර්යභාරය මා ඉතා අගය කරන අතර ආදායම් වැඩි කරගෙන එම මුදල පළාතේ සංවර්ධනයට යෙදවීම අපගේ මූලික අරමුණයි.

**පළාත් පාලන සංවර්ධනය**

ගරු සභාපතිතුමනි, 2016 සහ 2017 වසරවල අවස්ථා දෙකක දී ඇති වූ ගංවතුර ආපදා තත්ත්වයේදීත්, ගම්පහ දිස්ත්‍රික්කයේ පැවති සහ දැනටමත් පවතින නියං තත්ත්වයේදීත් පළාත් පාලන ආයතන පොදු ජනතාව වෙනුවෙන් ඉටු කළ මෙහෙය අති විශාල වන අතර එය මා ගෞරවයෙන් සිහිපත් කරනවා.

පළාත් පාලන ආයතන පළාතේ ජනතාවට ඉටු කරනු ලබන සේවාවන් සඳහා පළාත් සභාවෙන් ද විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනවා. 2016 වසරේදී ව්‍යාපෘති 1,524 ක් සඳහා රුපියල් මිලියන 672 ක ප්‍රතිපාදන ද, 2017 වසරේ මේ වන විට ව්‍යාපෘති 763 ක් සඳහා රුපියල් මිලියන 457 ක් ද වෙන් කර තිබෙනවා. මීට අමතරව ගංවතුරෙන් ආපදාවට ලක් වූ කළුතර දිස්ත්‍රික්කයේ පවුල්වල සනීපාරක්ෂක පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 54 ක්.

පසුගිය වසර සහ මෙම වසර තුළ පළාත් පාලන ආයතන මුහුණ දී ඇති ප්‍රබලතම තර්ජනය වූයේ කසළ කළමනාකරණය යි. ඒ සඳහා පවත්නා සම්පත් ප්‍රමාණවත් නොවීම සහ මහජන උද්ඝෝෂණ පළාත් පාලන ආයතන මුහුණ දෙන ප්‍රබලතම ගැටළුවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කසළ තෝරා වෙන් කර එකතු කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ගැටළු සහගත වී තිබෙනවා. එම නිසා පළාත් සභා ප්‍රතිපාදන යටතේ පොලිසැක් මලු 240,000 ක්, කොම්පෝස්ට් බඳුන් 3,130 ක්, ලීටර් 25 ප්ලාස්ටික් බඳුන් 79,000 ක්, බේලිං මැෂින් 19 ක් සහ බොබ් කැට් මැෂින් 2 ක් පළාත් පාලන ආයතන වෙත ලබා දීමට කටයුතු කළා. එසේම පළාත් පාලන ආයතන 47 කට ලබා දීම සඳහා රුපියල් මිලියන 462 ක් වටිනා කම්පැක්ටර් යන්ත්‍ර 29 ක් සහ ට්‍රැක්ටර් 43 ක් ඇණවුම් කර දැනටමත් ට්‍රැක්ටර් ලබා ගෙන බෙදා හැර අවසන්. වර්ෂය අවසන් වීමට පෙර කම්පැක්ටර් ද ලබා ගන්නවා.

පළාත් පාලන ආයතන 8 ක දැනට ගිනි නිවීම් ඒකක පවතිනවා. ඒවායේ පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බව අප කවුරුත් දන්නා කරුණක්. එම නිසා ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනයට රුපියල් මිලියන 40 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

2017 වර්ෂය සඳහා සියලු පළාත් පාලන ආයතන වෙනුවෙන් රුපියල් මිලියන 8,282 ක් වෙන් කළා. 2018 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 8,417ක් වෙන් කරනවා.

**විදුලි බලය**

ගරු සභාපතිතුමනි, රටේ සමස්ත විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 45 ක් පමණ නිෂ්පාදනය කරන්නේ ජලය ආශ්‍රයෙන්. එයිනුත් සියයට 81 ක නිෂ්පාදනයට දායක වන්නේ රාජ්‍ය අංශයයි. එම විදුලියෙන් අපේ පළාතේ ජනතාවගේ නිවෙස්වලට විදුලිය ලබා ගැනීමේ පහසුකම් සැපයීම අප විසින් කරනු ලබන කාර්යභාරයයි.

පළාත් සභාවක් වශයෙන් අපට වෙන් වන මුදලින් විදුලිබල ක්ෂේත්‍රය සඳහා විශාල මුදලක් වෙන් කිරීමේ හැකියාවක් නැහැ. එම නිසා විදුලිබල නිෂ්පාදනයට දායක වීමේ හැකියාවකුත් අපට නැහැ. නමුත් කසළ කළමනාකරණය මගින් විදුලි බලය නිෂ්පාදනයට දායක වීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව කරදියාන කසළ අංගනය මගින් විදුලිය නිෂ්පාදනය කිරීමේ කාර්යය Fairway Holding සමාගම වෙත පවරා ඇති අතර එමගින් විදුලිය මෙගා වොට් 10 ක නිෂ්පාදනයක් රට තුළට මුදාහැරීමට අප බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ට්‍රයිලොජි ආයතනය. අත්තනගල්ල, වේයන්ගොඩ දඹුවවත්ත ව්‍යාපෘතිය යටතේ මෙගා වොට් 3.5 ක්. එහෙම නැති වුණොත් 4.5 ක් අපි ජාතික විදුලිබල පද්ධතියට ඉදිරියේදී එකතු කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයට කේ.සී. ආයතනය හරහා විදුලිය නිෂ්පාදනය කිරීමත්, ඒ වාගේම කළුතර සහ කොළඹ ව්‍යාපෘති හරහා කොම්පෝස්ට් නිපදවීමේ ව්‍යාපෘති ඇති කරන්නටත් අපි දැනටම ටෙන්ඩර් කැඳවලා ආයෝජකයන් හඳුනා ගනිමින් සිටිනවා.

**පරිසරය රැක ගැනීම**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත, ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනයක් කේන්ද්‍රගතව සිටින, එමෙන්ම කුඩාම භූමි ප්‍රමාණයක් හිමි පළාතයි. ජනගහනයට සාපේක්ෂව කාර්මීකරණය සහ නාගරීකරණය ද හේතුවෙන් බස්නාහිර පළාත තුළ පරිසර සම්පත් කෙරෙහි ඇති කෙරෙන බලපෑම සුළු පටු නැහැ. එසේ වුවත් පළාතේ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේදී පරිසරය සහ පරිසර සංවර්ධනය පරදුවට නොතබන බව මම මෙම ගරු සභාවට කියන්න කැමතියි.

සීතාවකපුර නගර සභාවට අයත් "*වැවේ කැලේ*" වන භූමිය ප්‍රජා පාරිසරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතයි. මේ වන විට එහි සීමා මායිම් හඳුනාගෙන සලකුණු යොදා ආරක්ෂිත භූමියක් බවට පත් කර තිබෙනවා. 2018 වර්ෂයේදී එය පාරිසරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා. ඒ වාගේම ඉදිරියේදී අපි හඳුනාගන්නා, විශේෂයෙන්ම තෙත් බිම් කලාප ලෙස ඉදිරියේදී නම් කිරීමට හැකි වන ප්‍රදේශ ද මේ සඳහා එකතු කර ගන්නට අපි අපේක්ෂා කරනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය අයවැය ඉදිරිපත් කරමින් මා ප්‍රකාශ කළ පරිදි කැළණි ගඟ ආශ්‍රිත පරිසර පද්ධතිය දූෂණය වීම වැළැක්වීම සඳහා නිර්දේශ හඳුනා ගැනීම සහ ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සම්බන්ධ පර්යේෂණ කටයුතු මේ වන විට අවසන් කර තිබෙනවා. ලබන වර්ෂය තුළ එම නිර්දේශ පරිදි කටයුතු කිරීම අපගේ බලාපොරොත්තුවයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් පළාත් සභාවට සලසා ගැනීමට අපහසු වුවහොත් රජය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගන්නවා.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වූ "*වන රෝපා*" ජාතික රුක් රෝපණ වැඩසටහනට අනුව පළාත් පාලන ආයතන ද වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළා. සීතාවක ප්‍රදේශයේ "*ඉළුක් ඕවිට*" ගම්මානය කේන්ද්‍ර කර ගනිමින් පවුල් ඒකක 300 කට කළුවර පැළ සහ ගම්මිරිස් පැළ බෙදා දීමත්, අනෙකුත් පළාත් පාලන ආයතන වලට කුඹුක්, අඹ, නා වැනි බහුවාර්ගික දේශීය ශාක පැළ සහ ඔසු පැළ ලබා දීමටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ සංකල්පයක් අනුව අපේ පළාතේ කොස් පැළ ලක්ෂ පහක් බෙදා දීමේ ව්‍යාපෘතියත් ඉතාමත්ම සාර්ථක අන්දමින් මේ වන විට ක්‍රියාත්මක වන බවත් අවධාරණය කරන්න කැමැතියි.

වෙරළ ආශ්‍රිත සම්පත් මගින් දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය 1999 වර්ෂයේ සියයට 2 ක් වූ අතර මේ වන විට එය සියයට 3.5 ක් දක්වා වැඩි වෙලා. දළ දේශීය නිෂ්පාදනයට දක්වන මෙම දායකත්වය මීට වඩා සැලකිය යුතු මට්ටමකට ඉහළ නැංවිය හැකි බව මෑතකදී කරන ලද අධ්‍යයනයකදී හෙළි වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් මායිම් වලින් වැඩි ප්‍රමාණයක් වෙරළ ආශ්‍රිත ප්‍රදේශයි. එය සම්පූර්ණයෙන් පළාත් සභාවට අයත් විෂයයක් නොවුවත් වෙරළාශ්‍රිත ශාක, ප්‍රජාව, වාසස්ථාන, භූමිදර්ශ ආරක්ෂා කිරීම සහ එහි දර්ශනීය ස්වභාවය රැකගැනීමට පෞද්ගලික අංශයේද සහභාගීත්වයෙන් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. රජයේ ද සහය ලබා ගෙන ලබන වර්ෂය තුළ ඒ පිළිබඳ මූලික කටයුතු කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අද අපි මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි. විශේෂයෙන්ම ගංගා, ඇළ වේලිවලින් ගලාගෙන එන ජලය සමඟ මුහුදට එකතු වන කැළි කසළ, අපද්‍රව්‍ය සියල්ල එකතු කරලා මුහුදට යා නොදී ඒවා අරගෙන පළාත් පාලන

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ආයතන හරහා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න අපි දැන් කටයුතු කරගෙන යනවා. ඉදිරි දින කිහිපය තුළදී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අපි මූලික කටයුතු සිද්ධ කරලා තිබෙනවා.

**ජල සම්පාදන කටයුතු**

ගරු සභාපතිතුමනි, නැගී ගෙන එන ආර්ථිකයක අරමුණු ළඟා කර ගැනීමේදී රටේ ග්‍රාමීය මෙන්ම නාගරික ප්‍රදේශවලද ආර්ථික කටයුතු තුළ වර්ධනයක් සහ පුළුල් වීමක් සිදු විය යුතුයි. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් ජල සම්පාදනය සහ සනීපාරක්ෂක පහසුකම් දක්වන්න පුළුවන්. පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක කටයුතු සඳහා ප්‍රවේශ වීම "*සහශ්‍ර සංවර්ධන*" අරමුණුවලද එක් ඉලක්කයක් වීමෙන් එය තවදුරටත් තහවුරු වෙනවා.

තවමත්, අපගේ ග්‍රාමීය ප්‍රදේශ සඳහා පානීය ජල සම්පාදනයට වඩාත් සුදුසු ප්‍රභවය වන්නේ ආරක්ෂිත ළිං මගින් ජලය සපයා ගැනීමට ඉඩ හැරීමයි. එය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් මා දකින්නේ නැහැ. ජන සනත්වයෙන් වැඩි ග්‍රාමීය ප්‍රදේශ සඳහා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කර අදාළ පළාත් පාලන ආයතනවල අධීක්ෂණය යටතේ ඒවා ක්‍රියාත්මක කළ යුතුයි. ස්වාභාවික ආපදා සහ වෙනත් හේතූන් නිසා වර්තමානයේ ජල මූලාශ්‍ර දූෂණය වීමේ ප්‍රවණතාවයක් තිබෙනවා. එම නිසා පානීය ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහිද අපගේ අවධානය යොමු කළ යුතුයි.

ශ්‍රී ලංකාව පුරා වකුගඩු රෝගය ව්‍යාප්ත වන සීඝ්‍රතාවය සලකා බැලීමේදී බස්නාහිර පළාතේ පානීය ජලයෙහි වකුගඩු රෝගවලට මූලාශ්‍ර වන බැර ලෝහ පිළිබඳව පරීක්ෂාවන් සිදු කළ යුතුයි. ඒ අනුව ප්‍රජා ජල ව්‍යාපෘතිවල සහ ළිං ජලයෙහි ජල නියදි පරීක්ෂාව නොමිලේ සිදු කිරීමට දැනටමත් කටයුතු කර තිබෙනවා. මෙම කාර්යයන් වෙනුවෙන් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 24 ක ප්‍රතිපාදන වෙන් කළ අතර 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදන වෙන් කිරීමට අදහස් කරනවා.

ගරු සභාපතිතුමනි, මම ප්‍රජා ජල සංවිධාන හරහා මේ ව්‍යාපෘතිය තවත් පුළුල් කරන්නට අපේක්ෂා කළත්, සමහර වෙලාවට එම සංවිධානවලින් සහ ප්‍රාදේශීය ලේකම්කාර්යාලවලින්, ලේකම්වරුන්ගෙන් ලැබුණු අඩු දායකත්වය නිසා මම හිතන්නේ, අපට මීට වඩා ඉස්සරහාට යන්න තිබුණු අවස්ථාව නැති වුණාය කියලයි මම විශ්වාස කරන්නේ.

**සංචාරක සංවර්ධන කටයුතු**

ගරු සභාපතිතුමනි, සංචාරක කර්මාන්තය පිළිබඳ පළාත් සභාව වෙත පැවරී ඇති කාර්යභාරය අනුව, සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් හට තාක්ෂණික හා උපදේශාත්මක සේවා සැපයීම, පුහුණු කිරීම, භෞතික යටිතල පහසුකම් සැපයීම හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම වැනි කාර්යයන් අප විසින් සිදු කළ යුතුයි.

බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි වෙන් වෙන් වශයෙන් වැඩමුළු සංවිධානය කර සංචාරක ගමනාන්තයන් හඳුනාගත් අතර, ඒ අනුව හඳුනාගත් නව ගමනාන්තයන් ප්‍රමාණය 300 කට අධිකයි. මෙම සංචාරක කලාප සංවර්ධන වැඩසටහන් යටතේ 2018 වර්ෂයේ සංවර්ධනය කිරීමට යෝජිත අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

ගරු සභාපතිතුමනි, දෙස් විදෙස් සංචාරකයන්ට නැරඹිය හැකි ස්ථාන අපේ පළාතේ 300 කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මම මේ අවුරුද්දේ අපේ නිලධාරීන්ට උපදෙස් දුන්නා. පළමුව අපි කරන්න ඕනෑ, ඒ සංචාරක ස්ථාන නම් කරන එක. දැන් සමහර විට මේ ගරු මන්ත්‍රීවරුන්ගේ ගම්වල එවැනි ස්ථාන තිබුණත්, අපේ මන්ත්‍රීවරු දන්නේ නැහැ. ඒ නිසා අපි පළමුවෙන්ම ඒවා නම් කරලා, පළමුවෙන්ම යටිතල පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා යාමට ඇති මාර්ග සංවර්ධනය කිරීමට අපි මේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපි හඳුනාගෙන තිබෙනවා. මොකද, කෝට්ටේ රාජධානියේ. ඓතිහාසික ස්ථාන. කෝට්ටේ රාජධානියේ තිබෙන ඓතිහාසික ස්ථාන නැවත ප්‍රතිනිර්මාණය කරන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ අනුව අපි ඉදිරි වර්ෂයේදී සංචාරකයන්ගේ ආකර්ෂණය ලබා ගැනීම සඳහා එම ස්ථාන කිහිපයක් ප්‍රති නිර්මාය කරන්නටත් අපි කටයුතු කරනවා. ඒ වාගේම ඉදිරියේදී අපේ වහලා තිබෙන පාසලක් උපයෝගී කර ගනිමින් හෝටල් පාසලකුත් ආරම්භ කිරීමටත්, NVQ සහතිකය ලබා දීමටත් අපි කටයුතු කරන්න

බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම Welcome to Western Province කියන එක. ඒ බෝඩ් එක නැවත සකස් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

වර්තමානයේ සංචාරකයන් වැඩි නැඹුරුවක් දක්වනුයේ ඓතිහාසික ස්ථාන නැරඹීමට වඩා ත්‍රාසජනක අත්දැකීම් ලැබීමටයි. සංචාරක කර්මාන්තයේ විවිධාංගීකරණය මෙහිදී ඉතා වැදගත්. පාරිසරික සංචාරක කර්මාන්තය කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කළ යුතුයි. වනාන්තර හා ජීවීන් නැරඹීම, වන සංචරණය, කඳු නැගීම, ත්‍රාසජනක ජල ක්‍රීඩා, ස්වාභාවික ජල මාර්ග නැරඹීම, බෝට්ටු පැදීම, තල්මසුන් හා ඩොල්ෆින් වැනි මසුන් නැරඹීම වැනි පාරිසරික සංචාර කෙරෙහි ඔවුන් වැඩි කැමැත්තක් දක්වනවා. අප ඒවා තේරුම් ගෙන කටයුතු කළ යුතුයි. කළුතර දිස්ත්‍රික්කයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල වැනි ප්‍රදේශවල මෙම අවස්ථාවන් ඇති කරන්න පුළුවන්. මේ ආකාරයෙන් සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කළහොත් විශාල ආදායමක් උපයා ගැනීමට හැකි වෙනවා මෙන්ම වක්‍ර මාර්ගයෙන් රැකියා ජනිත කර ගන්නත් පුළුවන්. එම නිසා මේ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ලබන වර්ෂය තුළ කටයුතු කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

**ආර්ථික ප්‍රවර්ධන කටයුතු**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව යටතේ පිහිටුවා ඇති අධිකාරි අතරින් පුළුල් පරාසයක් තුළ ක්‍රියාත්මක කළ හැකි එකම අධිකාරිය ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයයි. පළාතේ ආර්ථික සංවර්ධනයට සහ ආදායම් ඉපයීම සඳහා ඕනෑම විෂයයක් යටතේ කටයුතු කිරීමේ හැකියාවක් එම කාර්යාංශයට පවතිනවා. වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය, වෙස්ප්‍රෝ කාර්යාල පරිශ්‍ර සෞඛ්‍ය ආරක්ෂණ සේවය සහ වෙස්ප්‍රෝ මුද්‍රණාලය වශයෙන් ප්‍රධාන ව්‍යාපෘති තුනක් දැනට කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන අතර මෙම ව්‍යාපෘති තුන යටතේ 900 කට වැඩි සංඛ්‍යාවකට රැකියා අවස්ථා සලසා දී තිබෙනවා. එසේම මෙම සෑම ව්‍යාපෘතියකින්ම ලාභ ලබන අතර වෙස්ප්‍රෝ ආරක්ෂක සේවයෙන් පමණක් 2016 වර්ෂයට රුපියල් මිලියන 11 ක ලාභයක් අපි උපයා ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට පත් වෙන කොට මේ වෙස්ප්‍රෝ ආයතනය තිබුණේ, පාඩු ලබන ආයතනයක් හැටියට. ඒක පාඩු ලබන ආයතනයක්. ඒක ලාභ ලබන ආයතනයක් බවට අපට පත් කර ගන්න පුළුවන්කම ලැබුණා. දැන් අපේ අමාත්‍යාංශ නිලධාරීන්ගේ චෝදනාව තමයි වෙස්ප්‍රෝ එකෙන් මුද්‍රණය කරන්න ගියාම අධික මුදලක් යනවා කියලා. ඒකට හේතුව තමයි වෙස්ප්‍රෝ එකට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය ප්‍රමාණයට තිබිලා නැහැ. ඒ නිසා මේ අයවැයෙන් අපි කිව්වා, වෙස්ප්‍රෝ ආයතනයේ තිබෙන මුද්‍රණාලය අංග සම්පූර්ණ මුද්‍රණාලයක් බවට පරිවර්තනය කිරීමෙන් පසුව වෙළඳපොළේ තිබෙන වටිනාකම් මත අපේ අමාත්‍යාංශවලට අවශ්‍ය පහසුකම් ඒ මුද්‍රණාලය හරහා ඇති කර ගන්න පුළුවන් කියලා. ඒ වාගේම ස්වයං රැකියා සඳහා කුඩා ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුළත් නාමාවලියක්, ඩිරෙක්ට්‍රියක් - අපි දන්නවා, නාගරික ප්‍රදේශ තුළ ඉන්න ජනතාවට තමන්ගේ නිවසේ තිබෙන, ගෙවත්තේ තිබෙන ගසක අත්තක් කපා ගන්න, ළිඳක් ඉහ ගන්න, එහෙම නැත්නම් පොල් කඩන මිනිහෙක් සොයා ගන්න අමාරුයි. ඒ වාගේ මිනිසුන් සොයා ගන්න අමාරුයි. දැන් ගම්වල ඒ වාගේ අය නැහැ. ඒ නිසා අපි ඩිරෙක්ටරියක් හදලා ලබා දෙන්න උත්සාහ කරනවා. ඒකෙන් දෙකක් වෙනවා. එකක් පළාතේ ජනතාවට සේවයක් වෙනවා. ඒ වාගේම පළාතේ ඒ වෘත්තියේ නියැලී සිටින අහිංසක ජනතාවට ඒකෙන් විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා. මොකද, අද තණකොළ ටික කපා ගන්නත් බාහිර කෙනෙකුගේ සහයෝගය අපේක්ෂා කරනවා. ඒ නිසා මම හිතන්නේ එය අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන හොඳ ව්‍යාපෘතියක්.

ඒ වාගේම පළාත් රාජ්‍ය සේවකයින්. 80,000 ක විතර සේවකයන් ඉන්න ආයතනයක් පළාත් සභාව. ඒ සේවකයන්ගේ සුභ සාධනය සඳහා සුභ සාධන වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒක අපි දැනට සාකච්ඡා කරමින් තිබෙන නිසා අහවල් එකය කියලා මම කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් යම් සුභ සාධන වැඩ පිළිවෙළක්. ඒ කියන්නේ ඒ අයට ආර්ථික වශයෙන් ශක්තියක් ලබා දිය හැකි වැඩ පිළිවෙළක්, ඒ කියන්නේ පොලී කාරයා ළඟට යන්නේ නැති, අධික පොලී ගෙවන බැංකුවලට නොයවා ඒ අයට යම් සාධාරණ විධියකට ණයක් ගන්න පුළුවන් විධියට පරිසරයක් අපි ආර්ථික ප්‍රවර්ධනය හරහා කරන්න පුළුවන්ද කියන එක පිළිබඳව අපි දැන් සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම දැන් ඉදිරියේදී රජය අයවැයෙන් බලාපොරොත්තු වන ආකාරයෙන් විදුලි ත්‍රීරෝද

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

රථ ලබා දීම සඳහා වැඩ සටහනක් ලබා දීමටත් අපි ආර්ථික ප්‍රවර්ධන අධිකාරිය හරහා සාකච්ඡා කරමින් යනවා.

ගරු සභාපතිතුමනි, ඉහත දැක්වූ ව්‍යාපෘති තුනට අමතරව මෙම කාර්යාංශය යටතේ මහා පරිමාණ ලාභ ලැබීමට හැකි ව්‍යාපෘති ආරම්භ කිරීමේ හැකියාවක් පවතින අතර, ඒ අනුව ලබන වර්ෂය තුළ නිවාස සැදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. එහිදී මෙම කාර්යාංශය යටතේ සමාගමක් ආරම්භ කිරීමටත් එම සමාගම යටතේ ඉඩම් මිලදී ගෙන නිවාස සෑදීම සහ ඒවා අලෙවි කිරීමටත් අපේක්ෂා කරනවා. ටෙලිකොම් ආයතනය, විදුලිබල මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන ද මේ අයුරින් කටයුතු කිරීම තුළින් විශාල ලාභ ලබන කාර්යක්ෂම ආයතන බවට පත් වෙලා තිබෙනවා. ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ද එවැනි පළාත් සභාවට බරක් නොමැති ආයතනයක් බවට පත් කිරීම අපගේ අභිලාෂයයි.

ගරු සභාපතිතුමනි, අපි දැන් නිවාස හදන්නය කියලා ඉඩම් බර ගණනක් බැලුවා. බලලා තක්සේරුව ගත්තා. අද තිබෙන වෙළඳ පොල වටිනාකමත් එක්ක අපේ රජයේ තක්සේරුවෙන් එන මුදල කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. දැන් කොළඹ නගරයේ තිබෙන ඉඩමක් ගන්න, රජය ඉතාමත්ම අඩු තක්සේරුවක් දෙන්නේ. අපි ඒ අභියෝගයට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මම මේ ගරු සභාවට යෝජනා කරනවා. මේ පළාත් සභාවට - දැන් තමුන්නාන්සේලා දන්නවා. අපි දැන් මාර්තු මාසයේ පළාත් සභාව හදලා එතැනට ගියත් එතැන වාහන 200 කට විතරයි නැවතුම් ස්ථාන තිබෙන්නේ. හැබැයි, මේ ආසන්නයේම තවත් ඉඩමක් අපි හඳුනාගෙන තිබෙනවා. ඉතාම මේ ආසන්නයේ ඉඩමක් අපි හඳුනාගෙන තිබෙනවා. නමුත් රජයේ තක්සේරුවට අනුව අපට ගන්න බැරි වෙනවා. ඉතින් තමුන්නාන්සේලා දන්නවා. තමුන්නාන්සේලා ඉඩමක් ගන්න ගියොත් මේ නගරයේ ඉඩමක වටිනාකම කීයද කියලා. ඒ නිසා මම හිතනවා, මේ ගරු සභාව අපට එවැනි තත්ත්වයන් තුළදී සභාව අපට එකඟතාවය ලබා දෙනවා නම්, රජයේ තක්සේරුව අභිබවන ඒ ඉල්ලුම්කරුවාගේ මුදලට යම් සාධාරණයක් වන මැදකදී අපට ඒ ඉඩම මිලදී ගන්න පුළුවන් වුණොත් එහෙම, ඒක ඉතාම වටිනවා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට අවධාරණය කරන්න කැමැතියි. මම එදා මහරගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉන්න කොට ඉදකි සමාගම ලංකා බැංකුවට සින්න වූ පර්චස් 80 ක ඉඩම මම එදා ගත්තේ හැට දෙලක්ෂ පනස්දාහකට. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට ඉන්න කොට. මේකේදී රජයේ තක්සේරුකරු එව්වේ, ලක්ෂ හැටකට තක්සේරු කරලා. ලංකා බැංකුව ඒකට කැමැති වුණේ නැහැ. ඒගොල්ලෝ කිව්වා, ලක්ෂ 60 ට ගත්තොත් ඒගොල්ලන්ට පාඩුයි. හැට දෙලක්ෂ පනස් දාහක් බැංකුවට එන්න තිබෙනවාය කියලා. මම තක්සේරුකරුට කියලා එවෙලේ ඒ දෙලක්ෂ පනස්දාහ වැඩි කරලා ගත්තා. මට ඒකට ඔඩිට් එකකුත් ආවා. නමුත් චාර්ජ් කළේ නැහැ. අද ඉඩමේ වටිනාකම කීයද? අද මහරගම පර්චස් එකක් ලක්ෂ 62 ක් විතර වෙනවා. ඒ නිසා මම මේ සභාවේ අවධානය යොමු කරනවා. මොකද, මේ රජයේ තක්සේරුකරුගේ ඒ ක්‍රමවේදය අනුව අපට කිසිම දෙයක් මේවා කර ගන්න බැහැ. මේ පළාත් සභාවේ අපේ තිබෙන ප්‍රතිපාදන පාවිච්චි කරලා - මේ ප්‍රතිපාදන අපි තියලා වැඩක් නැහැ. ඒ වාගේම පාරවල් හදන්න, වෙන දේවල්වලට මේවා ගන්න මම කැමැතිත් නැහැ. මම කියන්නේ, මේ තිබෙන ප්‍රතිපාදන අපි ආයෝජනය කරන්න ඕනෑ. මේ පළාත් සභාවේ ඉදිරි අනාගතය වෙනුවෙන්. ඒ පිළිබඳව සභාවේ තමුන්නාන්සේලාගේ අවධානය මම යොමු කරන්න කැමැතියි. අද අපි ඉඩමක් ගත්තොත් තව අවුරුදු දෙක තුනකින් ඒකේ වටිනාකම කීයද? පළාත් සභාවට සල්ලි නැති වුණොත් ඒ කාලේ ඉන්න අයට ඒක විකුණලා හරි පළාතේ ජනතාවට සේවය කරන්න පුළුවන්. නමුත් මම කියන්නේ, මේ පළාතේ ජනතාවගේ මුදල්. අපි මේවා බැංකුවල තියාගෙන ඉඳලා වැඩක් නැහැ. මේක ආයෝජනය කරන්න ඕනෑ. මේකේ ප්‍රතිලාභ මහජනතාවට ලැබෙන ආකාරයේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. දැන් අපි ඉඩමක් අරගෙන නිවාස ඉදි කර ගත්තොත් ඒකේ කුළිය මේ සභාවට ගන්න පුළුවන්. එතකොට හැමදාම අපි ආයෝජනය කරපු මුදල්වලට ආර්ථික වටිනාකම හැමදාම වැඩි වීමක් වෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරනවා.

**අපද්‍රව්‍ය කළමනාකරණය**

ගරු සභාපතිතුමනි, කසළ කළමනාකරණය පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති අතර, එම ව්‍යාපෘති අධීක්ෂණය හා දිශාගත කිරීම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ කාර්යභාරයයි. ඒ අනුව දැනටමත් කළුතර,

පොහොරවත්ත, කරදියාන, වත්තල සහ දික්ඕවිට යන ස්ථානයන්හි පළාත් පාලන ආයතන 12 ක් සම්බන්ධ කර ගනිමින් මධ්‍ය පරිමාණ කොම්පෝස්ට් අංගන 3 ක් පවතිනවා.

කරදියාන සම්පත් කළමනාකරණ භූමිය සඳහා දෛනිකව අපද්‍රව්‍ය ටොන් 500 ක් පමණ ලබා ගන්නා අතර, ඉන් ටොන් 200 ක් පමණ වෙන් කළ අපද්‍රව්‍යයයි. ඉන් ටොන් 125 ක් පමණ දෛනික කොම්පෝස්ට් සඳහා යොමු කරන අතර පාලිත බිම් පිරවීම සඳහා යොදා ගන්නා ප්‍රමාණය ටොන් 75 ක්.

අපි දන්නවා. අපි දැන් එතැන තිබෙන දූහද පාලනය කරලා, අපි ඒ ස්ථානයේ යම් වෙනසක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. ඉදිරියේදී වේස්ට් ටුවරිසම්වලට අපි මේ භූමිය යොදා ගන්න අපි කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. ඒ ආකර්ෂනීය ප්‍රදේශය තෙත් බිම් කලාපයක් හැටියට පත් කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, අපට මතකයි. ඒ කාලේ මානවසිංහයන් - අපේ හිටපු ගීත රචකයෙකු වන, ශ්‍රේෂ්ට කලාකරුවෙකු වන මානවසිංහයන් ඒ කාලේ තම ගීත ලිවීමට උපයෝගී කර ගත්ත ප්‍රදේශයක් තමයි කරදියාන බිම් තීරුව. දැන් ඔක්කොම ගිහිල්ලා කසළ දාලා අවලස්සන කරලා තිබෙන්නේ. ඒක අපි තෙත් බිම් කලාපයක් හැටියට, සංචාරකයින්ගේ ආකර්ෂනීය ප්‍රදේශයක් බවට තව අවුරුදු කිහිපයකින් පත් කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය බස්නාහිර පළාතේ එකතුවන මුළු කසළ ප්‍රමාණයෙන් සියයට 25 ක් පමණ දැනට භාර ගන්නවා.

මීට අමතරව පළාත් පාලන ආයතනවලට අයත් කොම්පෝස්ට් අංගන 23 ක් මගින් දෛනිකව ටොන් 120 ක් පමණ කොම්පෝස්ට්කරණය සඳහා යොදා ගැනීම ද සිදු වෙනවා.

ඒ වාගේම කරදියානේ අපි 2018 දී මිහිසරු සම්පත් මධ්‍යස්ථානයක්. ඒ කියන්නේ කසළ කළමනාකරණය පිළිබඳව පුහුණු මධ්‍යස්ථානයක් හදන්න සියලු කටයුතු අපි සූදානම් කරලා තිබෙනවා. ඒ වාගේම නොදිරන අපද්‍රව්‍ය එකතු කිරීමට කුඩා ප්‍රමාණයේ විශේෂිත මධ්‍යස්ථාන ඇති කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඉහත දැක්වූ පරිදි අපගේ අංගනවලට අපද්‍රව්‍ය භාරගත්තද මෙය අවසන් නොවන ඉතා බරපතළ ගැටළුවක් වෙලා. එහෙයින් මහා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිවල දැඩි අවශ්‍යතාවයක් මතු වෙලා. එම නිසා වසර 2020 සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා පරිමාණ ව්‍යාපෘති 2 ක් සඳහා දැනටමත් අප ගිවිසුම්ගත වෙලා තිබෙනවා. එමගින් කළමනාකරණය කිරීමට අපේක්ෂිත කසළ ප්‍රමාණය ටොන් 1,500 ක්. එසේම කොළඹ දිස්ත්‍රික්කයේ දෛනිකව ජනිතවන කසල ටොන් 500 ක් සඳහා ප්‍රසම්පාදනය කැඳවා ඉදිරි කටයුතු කරමින් පවතිනවා. මෙම ව්‍යාපෘති තුන සාර්ථකව ක්‍රියාත්මක කරවීමට හැකි වුවහොත් බස්නාහිර පළාතේ දෛනිකව ජනිත වන කසළ සඳහා ස්ථිර විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙනවා පමණක් නොවෙයි එය අප පළාත ලැබූ විශාල ජයග්‍රහණයක් ද වෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් කරදියාන, මීතොටමුල්ල ඇතුළුව අපේ කසළ රඳවනයන් 24 ක් බස්නාහිර පළාත තුළ තිබෙනවා. විවිධ ආයෝජකයන් අපට හම්බ වෙලා තිබෙනවා. අපි ඒ අයට කියලා තිබෙනවා, මේ එකතු කරලා ගොඩ ගහලා තිබෙන කැළි කසළවලට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නය කියලා. ඒගොල්ලෝ යෝජනා කිහිපයක් අපට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි කියලා තිබෙන්නේ, ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න එන්න. අපි ඒ සඳහා ඒගොල්ලන් එක්ක ඕනෑ වෙලාවක එකතු වෙන්න සූදානම් කියන එක අපි ඒගොල්ලන්ට කියලා තිබෙනවා. ඒ අනුව ඒගොල්ලෝ ආවොත් අපට පුළුවන් ඒ කුණු ටික ඒගොල්ලන්ගේ යන්ත්‍ර සූත්‍රවලට දීලා, මේ කුණු කඳු අපේ පළාතෙන් ඉවත් කර ගන්න හැකි වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

රුපියල් මිලියන 100 ක් වෙන් කරමින් ලබන වර්ෂයේ කරදියාන වැඩ බිමෙහි "*මිහිසරු සම්පත් පුහුණු මධ්‍යස්ථානයක්* " ඉදි කරනවා. අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, පර්යේෂණ කටයුතු කිරීම සහ රසායනාගාර සේවා සැපයීම එහි මූලික අරමුණයි.

දැන් ඔබතුමන්ලා දන්නවා. එතැනට ගියාම කාලගුණික තත්ත්වයන් පිළිබඳ වාර්තා ගන්නත්, ඒක අපට අංග සම්පූර්ණ, අපේ ලෝකයේ තිබෙන දියුණුම කසළ රඳවනවලින් එකක් බවට අපි කරදියාන කසළ රඳවනය පත්

කරලා තිබෙනවා. ඒ වාගේම එළඹෙන දෙසැම්බර් මාසයේ 28 වැනිදා සවස නෙළුම් පොකුණ රඟහලේදී මිහිසරු සම්මාන රාත්‍රිය. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට කසළ කළමනාකරණය කරන රාජ්‍ය, පෞද්ගලික සමාගම්, පාසල්, රෝහල් ආදී සියලුම ආයතනවලට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන සම්මාන රාත්‍රියක් පැවැත්වීමටත්, ඒ අය උද්යෝගිමත් කිරීමටත්, අගය කිරීමටත් වැඩ සටහනක් අපි මිහිසරු සම්මාන රාත්‍රිය නමින් නම් කරලා ලබන 28 වැනිදා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. නෙළුම් පොකුණ රඟහලේදී.

**අධ්‍යාපන කටයුතු**

අමාරුම එක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඇණ ගන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔන්න පහර නේද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

දැන් ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැන් හොඳම ගෝලයා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙච්චර කාලයක් ඕගොල්ලෝ කොටෝලා, කොටෝලා, ගේම් ගහලා. දැන් බැහැ. දැන් පුළුවන් නම් කොටවන්න කියන්න ඇමැතිතුමාත් එක්ක.

ගරු සභාපතිතුමනි, පළාත් සභාවන්ට පැවරී ඇති විෂයයන් අතුරින් විශාලම ක්ෂේත්‍රය අධ්‍යාපනය යි. සමස්ත අයවැය වියදමෙන් සියයට 39ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කිරීමෙන් ම මෙය නිවැරදි බව තහවුරු වෙනවා. පළාත් පාලන ආයතන ද ඇතුළුව අපගේ මුළු කාර්ය මණ්ඩලය 76,638ක් වන විට ඉන් 41,352 ක් එනම් සියයට 54 ක් අධ්‍යාපන කාර්ය මණ්ඩලය යි. ඒකෙන් පේනවා නේ ලොක්කා වැඩකාරයා කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලොක්කා කිව්වේ ඔබතුමාටද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. නැහැ. අපේ අධ්‍යාපන ලොක්කා.

පසුගිය දශකය ඇතුළත අධ්‍යාපනය වෙනුවෙන් විශාල මුදලක් අප වියදම් කර තිබෙනවා. මේ සමග අමුණා ඇති හත්වන උපලේඛනය අනුව පසුගිය වසර 10ක් තුළ අධ්‍යාපනය වෙනුවෙන් පුනරාවර්තන වියදම් යටතේ පමණක් වැය කළ මුදල රුපියල් මිලියන 151,068ක් පමණ වෙනවා. මෙසා විශාල මුදලක් වැය කරමින් බලාපොරොත්තු වෙන්නේ ඉදිරි සංවර්ධන දශකය සඳහා නොව සියවසක් දුරට සිතිය හැකි, සියවසක් දුරට යා හැකි ජාතියක් බිහි කිරීමයි. අපගේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වියදම් කරන විශාල මුදල් සම්භාරයේ වටිනාකම තේරුම් ගෙන වැඩ කළත් ඒ පිළිබඳ ඔවුන්ගේ අවධානය තවදුරටත් යොමුවිය යුතු යැයි මා අදහස් කරනවා.

පාසල් සහභාගීත්වය මැනීමට යොදා ගැනෙන පළමු ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා "*දළ රැඳී සිටීමේ අනුපාතය*" 2014 වසරේ සිට 2016 දක්වා සියයට 85.09 සිට සියයට 86.54 දක්වා වර්ධනය වී තිබෙනවා. පිරිමි දරුවෙකුගේ එම අනුපාතය සියයට 83.31 ක් වනවිට ගැහැණු දරුවෙකුගේ එම අනුපාතය සියයට 89.9 ක්. ඉන් ප්‍රකාශ වෙන්නේ ගැහැණු ළමුන්ට වඩා පිරිමි ළමුන් පාසැල් නොයන ප්‍රමාණය වැඩි බවයි. නැගෙනහිර පළාතේ මෙම අනුපාතය සියයට 75.59 ක් වන විට බස්නාහිර පළාතේ මෙම අනුපාතය සියයට 92.21 ක් ව පැවතීම අපට සතුටු විය හැකි කරුණක් වුවද මෙම අනුපාතය සියයට සියය මට්ටමේ රඳවා ගැනීමට අපගේ අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතු යියි මා යෝජනා කරනවා.

අප පළාතේ පළාත් සභාවට අයත් පාසැල් 1,288 ක් පවතිනවා. එය අනෙකුත් පළාත්වල පවතින පාසල් සංඛ්‍යාව සමග සැසඳීමේදී ඉතා ඉහළ අගයක්. එම පාසල්වල

නිරන්තරයෙන් නව ඉදි කිරීම් සිදු කිරීමට අවශ්‍යවීමත්, නිරන්තර නඩත්තු කටයුතු සිදු කළයුතු වීමත් සාමාන්‍ය තත්ත්වයක්. මේවා සඳහා වාර්ෂිකව විශාල මුදලක් වෙන් කළයුතු වුවත් අවශ්‍ය සම්පූර්ණ මුදලම වෙන් නොවන බව අප කවුරුත් දන්නා කරුණක්. එම නිසා ව්‍යාපෘති තෝරා ගැනීම පිළිබඳ අප මන්ත්‍රීතුමන්ලා අතර මතභේදකාරී තත්ත්වයක් පැවතුණත් "*ළඟම පාසැල හොඳම පාසැල*" ව්‍යාපෘතිය යටතේ අප පළාතට රුපියල් මිලියන 7,057 ක් වැනි විශාල මුදලක් ලැබීම අගය කළ යුතුයි. මේ යටතේ ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන, ගුරු නිවාස, විදුහල්පති නිවාස, තාක්ෂණික විද්‍යාගාර, ආපනශාලා වැනි නව ඉදිකිරීම් 165 ක් ගොඩ නැගෙනවා. ඒ වගේම පවතින ගොඩනැගිලි 1,209 ක් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය සිදුවෙනවා. මේ යටතේ රජයෙන් ලැබෙන මුදල් ලැබී 2017 ඔක්තෝබර් අග වනවිට රුපියල් මිලියන 1,928 ක් වියදම් කර තිබෙනවා. ඉතිරි මුදල් ද අවශ්‍යතාවය අනුව අපට ලැබෙන බව අපගේ විශ්වාසය යි. එම නිසා මුදල් ලැබීම පිළිබඳව ගැටළුවක් ඇතිකර නොගන්නා ලෙස මා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මෙම වැඩ සටහන ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ද රුපියල් මිලියන 4,000ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කර තිබෙනවා.

ඒ වාගේම දැන් අපි මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෑ. දැන් අපි අයවැයෙන් වෙන් කරලා තිබෙන ප්‍රමාණය බැලුවොත් පාසල්වල අවශ්‍යතා ප්‍රමාණයත් එක්ක විශාල පරතරයක්. ඒ නිසා තමුන්නාන්සේලා තීන්දු කරන්න ඕනෑ. දැන් අපි තව අවුරුදු 1 ½ කින් මැතිවරණයකට මුහුණ දෙනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරයි කියලා අපේක්ෂා කරනවා. විශේෂයෙන් අයවැය විවාදයේ දී තමුන්නාන්සේලාගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

අත්‍යාවශ්‍ය ඉගෙනුම් ක්‍රියාවලිය, පාසැල්වලට සෘජුවම මුදල් ලබාදීම වැනි කාර්යයන් සඳහා "*ගුණාත්මක යෙදවුම්*" යටතේ වර්ෂයකට රුපියල් මිලියන 400 කට ආසන්න විශාල මුදලක් වෙන් කරනවා. පසුගිය වර්ෂ ගණනාවක් තිස්සේ මෙම මුදල් එම වර්ෂය තුළම ඵලදායීව වියදම් නොවීම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයන් පැවතියත් වර්තමානය වනවිට එය යම් ප්‍රමාණයකට යහපත් වී පැවතීම අගය කළ යුතුයි. ලබන වර්ෂය සඳහා ද ගුණාත්මක යෙදවුම් වශයෙන් රුපියල් මිලියන 390 ක ප්‍රතිපාදන සලසනවා. ඒවා ඵලදායීව එම වර්ෂය තුළම වියදම් කරන ලෙස අධ්‍යාපන බලධාරීන් වෙත විශේෂයෙන් මා දැනුවත් කරන්න මා කැමතියි.

ගරු සභාපතිතුමනි, මේ මුදල් ප්‍රකාශය අනුව මධ්‍යම රජයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අපට වෙන් වුණේ, රුපියල් මිලියන 250 යි. ඉදිරියේ දී තවත් ආධාර එන්න පුළුවන්. ලෝක බැංකු ආධාර එන්න පුළුවන්. ඒ අනුව මම පළමුවරට අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම සඳහා අපගේ වෙන් වන මුදලින් මිලියන 400 ක් අපි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරලා තිබෙනවා. එයින් මිලියන 101 ක් අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන ව්‍යාපෘතියට වෙන් කරනවා. ඒක මන්ත්‍රීවරු අතර බොහොම ජනප්‍රිය ව්‍යාපෘතියක්. ඉහළ ප්‍රතිඵල ලැබෙන ව්‍යාපෘතියක්. ඒ සඳහා රුපියල් මිලියන 101 ක් වෙන් කරනවා. ගරු අධ්‍යාපන ඇමැතිතුමාට මම යෝජනා කරනවා, ගරු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරලා එම ව්‍යාපෘතිය ජනවාරි මස 01 වැනිදා සිටම පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්නය කියලා.

ගරු සභාපතිතුමනි, ලෝක බැංකු ප්‍රදාන යටතේ ද පසුගිය වර්ෂ ගණනාවක් තිස්සේ අපට මුදල් ලැබුණා. පසුගිය වර්ෂ පහ තුළ පමණක් රුපියල් මිලියන 1,646 ක ප්‍රතිපාදන ලැබී ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ යටතේ අවස්ථා ගණනාවක දී අපේ නිලධාරීන්ට විදේශ පුහුණු වීම් ලබා ගැනීමට ද හැකි වී තිබීම අගය කළ යුතු කරුණක්. ලබන වර්ෂය සඳහා ද ලෝක බැංකු ප්‍රදාන යටතේ රුපියල් මිලියන 83 ක ප්‍රතිපාදන වෙන් වී තිබෙනවා.

මා මුලින් සඳහන් කළා සේ 2018 වර්ෂය සඳහා අප විශාල මුදලක් අධ්‍යාපනය සඳහා වෙන් කරනවා. රුපියල් මිලියන 27,612ක් වූ එම මුදල සමස්ත අයවැයෙන් සියයට 39ක ප්‍රතිශතයක් සේම පසුගිය වර්ෂයට වඩා සියයට 25 ක වැඩිවීමක්.

**ක්‍රියාශීලී ජන සමාජයක්**

ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂ කිහිපය සලකා බැලූ කළ අප පළාත, ක්‍රීඩාව තුළින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති බව ක්‍රීඩා තරගවල ප්‍රතිඵල දෙස බැලූ විට

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

පෙනෙනවා. 2015 ජාතික මහා ක්‍රීඩා උළෙලේදී අප පළාත පදක්කම් 196 ක් හිමිකර ගත් අතර 2016 ජාතික මහා ක්‍රීඩා උළෙලේදී හිමිකර ගත් පදක්කම් සංඛ්‍යාව 254 ක්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් සහ පළාත් මට්ටමින් නිසි ප්‍රමිතියකට ක්‍රීඩා තරග පැවැත්වීමත් එම තරග හරහා දක්ෂතා ඇති ක්‍රීඩකයන් තෝරා ගැනීමට හැකි වීමත් පදක්කම් සංඛ්‍යාව වැඩි වීමට මූලික හේතුවයි. මෙම ක්‍රීඩා තරග පැවැත්වීමට අප විශාල මුදලක් ද වැය කරනවා. 2016 වර්ෂයේදී ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා රුපියල් මිලියන 16.8ක් වැය කර ඇති අතර එම ක්‍රීඩකයන්ට ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා රුපියල් මිලියන 10.8 ක් වැය කර තිබෙනවා. 2018 වර්ෂයේදී කරනු ලබන මෙම කටයුතු සඳහා රුපියල් මිලියන 37 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා. එය 2016 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 34.6 ක වැඩිවීමක්. මෙම වැඩියෙන් වෙන් කරන මුදල ක්‍රීඩකයන්ට නවීන පහසුකම් සහිත ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා වැය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ ප්‍රතිපාදන අපි වෙන් කරන්නේ, මගේ හිතේ කනගාටුවක් තිබෙනවා. මොකද ක්‍රීඩකයෙක් හැටියට මට අවශ්‍ය වෙනවා මීට වඩා - මොකද අපේ පළාතේ මම නම් තවම කප් එක ගන්න ගියේ නැහැ. අපේ ඇමැතිතුමා තමයි කප් එක ගන්න ගියේ. ඉස්සර තිලකසිරි ගරු ඇමැතිතුමා ගියා කප් එක ගන්න. දෙන්නම අපේ පළාතේ ඉන්න කප් ගහපු දෙන්නෙක්. ඒ නිසා මම තවම ගියේ නැහැ, කප් එකක් ගන්න. ගරු සභාපතිතුමනි, අපි මීට වඩා මොකද මේ ක්‍රීඩකයන් කියන්නේ ගම්වල ඉන්න බොහොම හැකියාව තිබෙන අයයි. ක්‍රීඩාවට අවශ්‍ය දක්ෂතාවය තිබෙන්නේ, කැපවීම තිබෙන්නේ, ශාරීරික ශක්තිය තිබෙන්නේ ඉහළ පවුල්වල ඉන්න කෘතිම ආහාර ගන්න අයට නොවෙයි. ගම්වල ගහෙන් කොළෙන් ආහාර ගන්න දරුවන් තුළ තමයි ඒ ශක්තිය තිබෙන්නේ. ඒ නිසා මීට වඩා යමක් මේ ගමේ ක්‍රීඩකයන්ට කරන්න ඕනෑ. ඒ සඳහා ප්‍රතිපාදන මට වුණත් දෙන්න පුළුවන්. විෂයය භාර ගරු ඇමැතිතුමාගේ අවධානය ඒ වෙනුවෙන් යොමු කරනවා.

ගරු සභාපතිතුමනි, සාම්ප්‍රදායික ක්‍රීඩා ඉසව්වලට සීමා වී නොසිට ලෝකයේ නව ප්‍රවණතා කෙරෙහි ද අපගේ අවධානය යොමු කළ යුතුයි. ඒ අනුව ත්‍රාසජනක ක්‍රීඩා සහ ජල ක්‍රීඩා සඳහා පවතින පහසුකම් නංවාලීම වැදගත් වෙනවා. කඳු නැගීම, කඳු මතින් පාපැදි පැදීම, බැවුම් තරණය, ඔරු පැදීම, දිය මත ලිස්සා යෑම වැනි ක්‍රීඩා තරග ඉසව්වලට ඇතුළත් කළ යුතුයි. මේ සඳහා පෞද්ගලික අංශයේ ද සහය ලබා ගත යුතුයි. එසේ සහය ලබා දීමට සමාගම් වැනි පෞද්ගලික ආයතන සූදානම්ව සිටින බව මා දන්නා කරුණක්.

**සංස්කෘතික සහ ජාතික උරුමය**

ගරු සභාපතිතුමනි, දැනට අවුරුදු 20 කට 30 කට පෙර අප කුඩා කාලයේ පැවති කලාවන්, සංස්කෘතික උරුමයන් දැන් ක්‍රමක්‍රමයෙන් සමාජයෙන් ගිලිහී යනවා. තොවිලයක්, දහඅට සන්නි නැටුමක් අද කාලයේ දරුවන්ට කිසිසේත් දකින්න නැහැ. ඒවා කළ හැකි දැනුමැති අය නොමැති වීමත්, අධික වියදමක් දැරීමට සිදු වීමත් මේවා දුලභ වීමට ප්‍රධානම හේතුවයි. නමුත් ආගමික ස්ථානවල පවතින පෙරහැරවල් තවමත් අප සමාජයේ පවතිනවා. මේවා සංවිධානය කරනු ලබන ආගමික ස්ථානයන්හි ගරුතර ස්වාමීන් වහන්සේලා සමග සාකච්ඡා කිරීමේදී, උන්වහන්සේලාගේත් අදහස වනුයේ අධික වියදම නිසා මේවා සංවිධානය කළ නොහැකි තත්ත්වයකට පත් වී ඇති බවයි. එම නිසා පෙරහැරවල් සඳහා දැනට දෙනු ලබන රු.100,000/- ක ආධාර මුදල රු.200,000/- දක්වාත් මෙතෙක් දුන් රු.200,000/- ආධාර මුදල රු.500,000/-දක්වා ත් වැඩි කිරීමට මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කමිටුවලට ගිහිල්ලා අපේ ගරු මන්ත්‍රීවරු එතැන සිට මට දුරකථනයෙන් කථා කරනවා. ඉතින් අපේ සංස්කෘතියෙන් අමාත්‍යාංශයෙන් දෙන්න පුළුවන් රුපියල් 25,000/- යි. ඉතින් රුපියල් 25,000/- යි දෙන්න පුළුවන් කියලා අපේ මන්ත්‍රීවරයෙක්ට ආත්ම ගරුත්වයක් ඇතිව කියන්න පුළුවන්කමක් නැහැ. අනික එවැනි යෝජනා හැමදාම එන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ නිසා එම රුපියල් 25,000 යේ දීමනාව රුපියල් 100,000/- ය දක්වා වැඩි කරන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමා මගින් යෝජනා කරනවා. දැන් ආදාහනයක් වුණාම අපේ නීතිරීතිවල ප්‍රොටකෝල් එකේ රාජ්‍ය අනුග්‍රහය දෙන්නේ මහනායක ස්වාමීන් වහන්සේලාට සහ ඒ අනුනායක ස්වාමීන් වහන්සේලාට.

උන්වහන්සේලාට අදාහනයක් කරගන්න එහෙම ආර්ථික ප්‍රශ්නයක් නැහැ. හැබැයි ගම්වල ඉන්න අහිංසක මහජනයා වෙනුවෙන් වැඩ කරපු, අවමංගලායයට, පිරිතට ඔක්කොටම ගිය අහිංසක ස්වාමීන් වහන්සේ කෙනෙක් වෙනුවෙන් අපට කරන්න දෙයක් නැහැ. ඒ නිසා මම හිතනවා. මේ පළාත් සභාවේ සියලු මන්ත්‍රීවරුන් ගේ එකඟතාවය අනුව එවැනි අවස්ථාවකදී රුපියල් 100,000 යේ ඉඳගෙන යම් තීන්දුවක් ගත්තොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ විවිධ රාජධානි ගණනාවක් පැවති බව අප කවුරුත් දන්නා කරුණක්. මෙම රාජධානි අතුරින් අප පළාතට වඩාත් වැදගත් වන්නේ කෝට්ටේ රාජධානි යුගය යි. කෝට්ටේ යුගයේ පැවති අභිමානවත් සංස්කෘතික උරුමය රැක ගැනීම, ආරක්ෂා කිරීම සහ ප්‍රචාරය කිරීම අපගේ වගකීමක් යැයි මා දකිනවා. අනුරාධපුර යුගයේ, පොළොන්නරු යුගයේ මෙන් කෝට්ටේ යුගයේ සංස්කෘතික උරුමයන් දැකිය හැකි ස්ථාන දුලබයි. එම නිසා තට්ටු 15 කින් යුක්තව ඉදිවෙන පළාත් සභා ගොඩනැගිල්ලේ කෝට්ටේ යුගයට අයත් සංස්කෘතික ලක්ෂණයන් පෙන්නුම් කරන ආකාරයට සැකසීමට අපි දැනටමත් කටයුතු කරලා තියෙනවා. එම යුගයට අයත් කැටයම් කලාව, චිත්‍ර කලාව සහ මූර්ති කලාව එම ගොඩනැගිල්ලේ පිළිඹිබු කරන අතර එමගින් කෝට්ටේ යුගයේ උරුමයන් ආරක්ෂා කිරීම සහ ප්‍රචාරය කිරීම අපගේ මූලික අරමුණයි.

කෙසේ වුවත් සංස්කෘතික කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේ රුපියල් මිලියන 47 ක් ප්‍රතිපාදන වෙන්කළ අතර 2018 වර්ෂයට රුපියල් මිලියන 43 ක් ප්‍රතිපාදන අපි සලසන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ ඒ නව ගොඩනැගිල්ලේ අපි ඉදි කරන කැටයම් කලාව එදා ඉතිහාසයේ පාවිච්චි කරපු ලී දඬුම ඉතිහාසයේ ඒ නිර්මාණකරුවන් ඒ රාජධානියේ නිර්මාණකරුවන් යොදා ගත් ලී දඬුම මේ කාලයේ අපටත් යොදා ගන්න ලැබීම විශාල ජයග්‍රහණයක් හැටියට මා දකින්න කැමැතියි. (බාධා කිරීමක්)

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සීතාවක රාජධානිය

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රශ්නයක් නැහැ නේ? වැඩේ යන්න මම ඉන්නවා නේ. ගරු මන්ත්‍රීතුමා, එතකොට මහරගමට පොම්ප කරන්නේ නැතිව දෙන්න පුළුවන්. වැඩ කරනවා නම් දෙන්න පුළුවන්. සීතාවක රාජධානිය හදන්න බැහැ. රජවරු දෙන්නෙක් ඉන්නවා නේ. මට දෙන්න එකතු වෙලා එක යෝජනාවක් දෙන්න ඕනෑ. නැත්නම් දෙන්නා යෝජනා දෙකක් දෙන්න ඕනෑ. මම සීතාවක රාජධානිය ගන්නේ කවුද? සුමිත්ව ගන්නද? ඔයාව ගන්නද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

සීතාවක රාජධානිය තමයි ජාතික උවමනාව වෙනුවෙන් පෙනී සිටියේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම බැලුවොත් අපේ උප සභාපතිතුමා කියයි රයිගමත් ගන්න කියලා.

**තොරතුරු තාක්ෂණය**

ගරු සභාපතිතුමනි, මෑත වර්ෂවල තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ පුළුල් පිබිදීමක් ඇති වී තිබෙනවා. මේ තුළින් දේශීය සමාගම් රාශියක් ශක්තිමත් වී තිබෙන අතර ඒවා සියල්ල අප පළාතේ පවතින සමාගම්. තොරතුරු තාක්ෂණය ආශ්‍රිත පර්යේෂණ කටයුතු ද පුළුල් වී තිබෙනවා. දැනට මෙම කර්මාන්තයේ 65,000 ක් පමණ රැකියාවල නියුක්ත වන අතර ඉදිරි වර්ෂ තුන තුළ 150,000 ක් පමණ රැකියාවල නියුක්ත වේ යැයි අපි අපේක්ෂා කරනවා.

බස්නාහිර පළාතට අයත් සියලු පළාත් සභා ආයතනවල කටයුතු පරිගණක ගත කිරීම සහ සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීමට " *තොරතුරු තාක්ෂණ මාර්ග සිතියමක්* " (ICT Road Map) සැකසීම සඳහා විදුලි සංදේශ අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීම

මේක පොඩ්ඩක් වැදගත් වෙනවා.

පරිදි භාණ්ඩාගාරයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අනුමැතිය ලැබී තිබෙනවා. එම සැලැස්ම 2018

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

වර්ෂයේ සැකසීමට බලාපොරොත්තුවන අතර ඒ සඳහා අවශ්‍ය මුදල් ද භාණ්ඩාගාරයෙන් ලැබී තිබෙනවා.

රුපියල් මිලියන 06 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබෙනවා. ඉතිරි මුදල් අපි දෙන්න කැබිනට් මණ්ඩලය, අපි අනුමත කළා.

මෙම සියලු කටයුතු සම්බන්ධීකරණය සහ තොරතුරු තාක්ෂණය පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ කාර්යය අපගේ තොරතුරු තාක්ෂණ සම්පත් ආයතනය වෙත පැවරී තිබෙනවා. එම ආයතනය සඳහා රුපියල් මිලියන 40 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා.

ඒ පිළිබඳව පොඩි සටහනක් මම කියවන්න කැමැතියි. එදිනෙදා කටයුතු සඳහා මහජනතාව සඳහා ලබා දෙන සේවාව ඩිජටල්කරණය තුළින් වඩාත් කාර්යක්ෂමව ලබා දීමට හැකිවනු ඇත. ගරු සභාපතිතුමනි, අපි විවිධ තාක්ෂණ යුගයන් පසුකර ඇවිල්ලා අපි දැන් ඩිජිටල්කරණය වෙලා තිබෙන්නේ. ඩිජටල් තාක්ෂණය ක්‍රියාත්මක නොවුණොත්, රටේ තිබෙන දියුණු පළාත හැටියට කඩිනමින් අපට ඒ සඳහා යාගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඩිජටල් තාක්ෂණයට යාම සඳහා අපි දැන් සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. සියලුම කාර්යාල සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති නිර්මාණය කරමින් පළාත් සභාවේ සියලුම කාර්යාල ඩිජටල් තාක්ෂණය තුළින් සියලුම කාර්යාල ජාලගත කරනු අතර එමගින් තැපැලෙන් හෝ ෆැක්ස් මගින් ලිපි ගනුදෙනු කිරීමේ අවශ්‍යතාවය පැන නොනගින අතර මූල්‍ය පරිපාලනය ඇතුළු සියලුම කටයුතු වඩාත් විනිවිධභාවයකින් යුතුව කිරීමට ද ඒ අනුව අපට හැකි වෙනවා. ඩිජටල් පැමිණි පසු අපගේ රාජකාරී කටයුතු මීට වැඩිය කාර්යක්ෂම වන බව තමයි පැහැදිලි වන්නේ. ඒ අනුව රජයෙන් ලැබෙන ප්‍රදානවලට අමතරව අපේ පළාතෙන් ප්‍රතිපාදන ලබා දෙන්නය කියලා කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන්න කැමැතියි.

**සෞඛ්‍ය සේවාව**

ගරු සභාපතිතුමනි, සම්පත් හිඟ තත්ත්වයක් පැවතිය ද, ප්‍රධාන සෞඛ්‍ය දර්ශක අතින් අනෙකුත් ඉහළ ආදායම් ලබන රටවලට වඩා අපේ රටේ සෞඛ්‍ය දර්ශක යහපත් තත්ත්වයක පැවතීම අගය කළ යුතුයි.

කොහොමද ඇමැතිතුමාගේ වැඩ. අහගන්න.

සෞඛ්‍ය සේවයේ නියුතු පුද්ගලයින්ගේ කැපවීම මෙයට හේතු වී තිබෙන අතර එය කාලයක් තිස්සේ පැවති හොඳ ප්‍රවණතාවයක ප්‍රතිඵලයක්. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අපේ රට, මැලේරියාව සහ බරවා රෝගය සහමුලින්ම තුරන් කළ රටක් වශයෙන් සහතික කර තිබෙනවා. පසුගිය වර්ෂ තුනක කාලය තුළ මෙවැනි රෝගියෙකු වාර්තා නොවීම මෙම සහතිකය ලැබීමට ප්‍රබලම හේතුවයි. මෙය සෞඛ්‍ය සේවාවේ නිරත පුද්ගලයින් විසින් පෙන්නුම් කරන ලද ඉහළ වෘත්තීමයභාවය සහ කැපවීම පිළිබිඹු කරන හොඳ සාක්ෂියක්.

මේ අයුරින් අපේ රට බෝවන රෝග අවම කිරීම අතින් සාර්ථකත්වයක් අත්කර ගෙන තිබුණත්, ඩෙංගු රෝගය පාලනය අතින් අප අභියස අභියෝග රාශියක් පවතිනවා. බස්නාහිර පළාතේ දැනට පවතින වසංගත රෝග අතරින් ප්‍රධානම රෝගය ඩෙංගු රෝගයයි. ලංකාවේ වාර්තාවන රෝගීන්ගෙන් සියයට 50 කට ආසන්න සංඛ්‍යාවක් වාර්තා වෙන්නේ බස්නාහිර පළාතෙන්. 2016 ජාතික මට්ටමේ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 55,150 ක් වන විට බස්නාහිර පළාතේ රෝගීන් සංඛ්‍යාව 24,230 ක්. 2017 අගෝස්තු වන විට දිවයිනේ රෝගීන් සංඛ්‍යාව 144,052 ක් වන විට බස්නාහිර පළාතේ රෝගීන් සංඛ්‍යාව 59,075 ක්. 2016 වර්ෂයේ පළාතේ ඩෙංගු රෝග නිසා වාර්තා වූ මරණ සංඛ්‍යාව 43 ක්. නමුත් 2017 වර්ෂයේ අගෝස්තු දක්වා මාස 8 ට මරණ 152 ක් වාර්තා වෙනවා. රටේ ඇතිවූ අයහපත් කාලගුණික තත්ත්වයත්, මහජනතාව මේ කෙරෙහි දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවීමත් ද මෙම තත්ත්වයට හේතු වී තිබෙනවා. ඩෙංගු රෝගය පාලනය කිරීමේ ක්ෂණික පියවරයන් වශයෙන් පහත දැක්වෙන යෝජනා මෙම වර්ෂය තුළ දැනටමත් ක්‍රියාත්මක කර තිබෙනවා.

1. ඩෙංගු රෝගය බහුලව පැතිරෙන්නේ පාසැල් ආශ්‍රිතවයි. එම නිසා ඒ පිළිබඳ දැනුමැති උපාධිධාරී අභ්‍යාසලාභීන් 290 ක් බඳවාගෙන පාසැල් 5කට එක් අයෙකු බැගින් අනුයුක්ත කළා. ඔවුන්ට පවරා ඇති වැදගත්ම රාජකාරිය වන්නේ නිරන්තර අධීක්ෂණයට ලක් කර ඩෙංගු රෝග පැතිරෙන ස්ථාන තුරන් කිරීම සහ මේ පිළිබඳව ළමුන් සහ ගුරුවරුන්ව නිරන්තරයෙන් දැනුවත් කිරීමයි.

2. ජාතික ඩෙංගු මර්දන ඒකකයේ ද සහය ඇතිව ඩෙංගු මර්දන සහායකයින් 500 දෙනෙකු ගෘහ ආශ්‍රිත ඩෙංගු මර්ධන සහ එම අධීක්ෂණ කටයුතු සඳහා යෙදවීම.

3. හොරණ, පානදුර, පිළියන්දල, තලංගම, වැතර, කිරිබත්ගොඩ හා මීරිගම යන රෝහල්වල හදිසි ඩෙංගු ප්‍රතිකාර ඒකක පිහිටුවීම.

4. වැතර, මීනුවන්ගොඩ සහ හෝමාගම යන රෝහල්වල අංගසම්පූර්ණ ඩෙංගු වාට්ටු සඳහා තට්ටු 5 කින් යුත් ගොඩනැගිලි සෑදීම. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2017 පරිපූරක ඇස්තමේන්තුව යටතේ සහ 2018 මුදල් ප්‍රකාශයෙන් සලසා තිබෙනවා.

අපි පරිපූරකයෙන් ඒවාටත් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

මේ වන විට බස්නාහිර පළාතේ ද වකුගඩු රෝගීන් වැඩිවීමේ ප්‍රවණතාවයක් අනාවරණය වෙලා. මෙම රෝගයට ගොදුරු වූවන් නිවාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරමින් මීගමුව, ගම්පහ, වතුපිටිවල, හෝමාගම, හොරණ සහ පානදුර යන රෝහල්වල රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ආරම්භ කර තිබෙනවා. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ ද වෙන් කරනවා. මෙම රෝගයේ බලපෑමට ලක්වන ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම රෝගය ඇති වීම වැළැක්වීමට ගත යුතු ක්‍රියා මාර්ගයයි. ලබන වර්ෂය තුළ ඒ කෙරෙහි ද සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන ආයතනවල අවධානය යොමු විය යුතුයි.

ගරු සභාපතිතුමනි, හිඟයකින් තොරව සාධාරණ මිලකට ඖෂධ සහ වෛද්‍ය උපකරණ ලබාදීමට අතිගරු ජනාධිපතිතුමා ලබා දුන් පොරොන්දුව මත ඖෂධ වර්ග 48 ක මිල ගණන් සියයට 40 කින් අඩුකර තිබෙනවා. මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යවරයාටත් අපගේ ගෞරවය පිරිනැමිය යුතුයි. මේ තුළින් අඩු ආදායම් ලබන ජනතාවට විශාල සහනයක් ලැබී තිබෙනවා. විශේෂයෙන් දෛනිකව ඖෂධ ලබා ගන්නා වැඩිහිටියන්ට විශාල සහනයක් බව මා පෞද්ගලිකව දන්නා කරුණක්.

අනික් එක ගරු සභාපතිතුමනි, මේ යහපාලන රජය මම දකින්නේ ඉතාමත් හොඳ වැඩක් තමයි මේ ඖෂධවල මිල අඩු කිරීම. ඒක ඉතාමත් අපි අගය කරනවා. විශේෂයෙන් ජනාධිපතිතුමාටත්, රජයටත්, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න ඇමැතිතුමාටත් ඒ කාරණය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න කැමැතියි. අගමැතිතුමාටයි.

දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ ජනතාවට ලැබෙන නිදහස් සෞඛ්‍ය සේවාව ඔවුන්ට විශාල සහනයක්. එම පහසුකම දිගටම ලබා දීමට ද අප බැඳී සිටිනවා. නමුත් මේ සඳහා යොදවන අති විශාල මුදල් ප්‍රමාණයේ වටිනාකම පිළිබඳ ජනතාව දැනුවත් විය යුතුයි. පෞද්ගලික රෝහලක දින කිහිපයක් නැවතී සිටියහොත් වැය වන මුදල දෙස බැලූවිට රජයේ රෝහලක කරන කාර්යභාරයේ වටිනාකම පෙනෙනවා. එම නිසා රජයේ රෝහලක දින කිහිපයක් හෝ නතර වී සිට ඉවත්වන රෝගියෙකුට ඔහු වෙනුවෙන් වැය වූ මුදල කියන්න පුළුවන්නම්, තමා වෙනුවෙන් වැය වූ මුදල ඔහුට දැන ගැනීමට හැකි වෙනවා මෙන්ම ඉදිරියේ දී රෝග වළක්වා ගැනීමට ද ඔහු උත්සාහවන්ත වෙනවා. එබැවින් මෙකී කරුණු කෙරෙහි සෞඛ්‍ය අංශවල අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අපගේ මුදල් ප්‍රකාශයේ විශාල මුදලක් සෞඛ්‍ය අංශයට වෙන් කරනවා. ඒ අනුව 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 12,359 ක ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

ඇමතිතුමාට ඇහුණාද දන්නේ නැහැ.

**ආයුර්වේද වෛද්‍ය සේවය**

ගරු සභාපතිතුමනි, අප පළාතේ, ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද රෝහල් 9 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 18 ක්, පංචකර්ම මධ්‍යස්ථාන 2 ක් තිබුණත් මේවාට අවශ්‍ය ආයුර්වේද ඖෂධ මිලදී ගන්නේ ඒ ඒ අවස්ථාවේ ඇණවුම් කරලයි. තොග වශයෙන් මිලදී ගෙන ගබඩා කර තබා ගැනීමක් කර ඒවා අවශ්‍ය අවස්ථාවලදී රෝහල් වෙත බෙදා හැරීමක් සිදුවන්නේ නැහැ. මේ නිසා සමහර අවස්ථාවලදී ඖෂධ හිඟයක් ඇතිවෙනවා මෙන්ම මිලදී ගැනීමට අවශ්‍ය විට ඒවා වෙළෙඳපොලේ නොමැතිවීමෙන් පමා වීමක් ද සිදු වෙන්න පුළුවන්. නමුත් අප ආයුර්වේද ඖෂධ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 100ක් වැනි විශාල මුදලක් වාර්ෂිකව වෙන් කරනවා. එම වෙන් කරන මුදලේ සම්පූර්ණ ප්‍රතිලාභ

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

රෝගියා වෙත යා යුතුයි. එම නිසා ආයුර්වේද මධ්‍යම ඖෂධ ගබඩාවක් ඇති කිරීමත් ඖෂධ පාලකවරයෙකු යටතේ එය පාලනය කිරීමත්, එමගින් අවශ්‍ය ඖෂධ රෝහල් වෙත බෙදාහැරීමත් කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2018 මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා.

රටේ සමාජ, ආර්ථික, ජනගහන හා ජීවන රටාවල සිදුවන වෙනස්කම් හේතුවෙන් නිදන්ගත බෝනොවන රෝග ද පළාතේ සෞඛ්‍ය අංශයට විශාල අභියෝගයක්. සෞඛ්‍යයට අහිතකර ආහාර රටාව සහ ව්‍යායාමවලින් තොර ජීවන රටාව නිදන්ගත බෝ නොවන රෝගවලට මූලික හේතුවයි. දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ නිවැරදි ආහාර රටාවකටත්, ව්‍යායාමවලටත් ජනතාව හුරු කරන්න පුළුවන්. ළදරු වියේ සිට වැඩිහිටි අවධිය දක්වා සියලු වයස් කාණ්ඩ ආවරණය වනසේත්, උපතේ සිට මරණය දක්වා මුළු ජීවිත කාලය පුරාම කුමන ආකාරයේ ආහාර රටාවකට සහ කුමන ආකාරයේ ව්‍යායාමවලට හුරු විය යුතුද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දිය යුතුයි. ඒ සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් කළයුතු වෙනවා. මෙකී කාර්යය තේරුම් ගෙන ලබන වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සඳහා රුපියල් මිලියන 20 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

බටහිර වෛද්‍යවරුන්ට සේම දේශීය වෛද්‍යවරුන්ට ද ගෞරවාන්විත පරිසරයක් පැවතිය යුතුයි. අපගේ ආයුර්වේද රෝහල්වල නිල නිවාස නොමැතිවීමත්, පවතින ඒවා ද අබලන්ව පැවතීමත් විශාල ගැටළුවක් වෙලා. එම නිසා ඉදිරි වර්ෂ කිහිපය තුළ මෙම රෝහල්වල නිල නිවාස සෑදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට මා බලාපොරොත්තු වෙනවා.

ආයුර්වේද ක්ෂේත්‍රයේ සියලු කාර්යයන් සඳහා වාර්ෂිකව අප විශාල මුදලක් වෙන් කරනවා. ඒ අනුව 2018 වර්ෂය සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 579 ක ප්‍රතිපාදන වෙන් කරන අතර එය 2017 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 15 කවැඩි වීමක්.

**දරුවන්ගේ රැකවරණය**

ගරු සභාපතිතුමනි, දැනටමත් ආයතනගත වූ දරුවන් 4,811 දෙනෙකුගේ හෙට දවස වඩාත් සුරක්ෂිත හා ඵලදායී ජීවිත කිරීම සඳහා අපගේ පරිවාස දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් කරනවා. වෘත්තීය පුහුණුවීම් ලබාදීම, මානසික සුභසාධනයට විවිධ වැඩ සටහන් පැවැත්වීම, දෙමව්පියන් නොමැති දරුවන්ට සුදුසු භාරකරුවන් සොයා දීම, රැකියා ලබා දීම, විවාහ කරදීම එවැනි කාර්යයන්ගෙන් කිහිපයක්.

නිදහස් ජීවිතයක් ගත කරන දරුවකු තම කාලයෙන් වැඩි ප්‍රමාණයක් විනෝදය සඳහා වැය කරනවා. ආයතනගතව අප යටතේ රැකවරණය ලබන දරුවන්ට එවැනි විනෝදයක් ලබා නොදුනහොත් එය ඔවුන්ට කරන විශාල අපරාධයක්. එම නිසා පසුගිය කාලය තුළ අප ඔවුන්ට හුණුවටයේ කථාව, සිංහබාහු වැනි වේදිකා නාට්‍ය නැරඹීමටත්, ආලෝකෝ උදපාදී, අලි කථාව වැනි චිත්‍රපට නැරඹීමටත්, රටතුළ ප්‍රසිද්ධ ගායක ගායිකාවන් ගෙන්වා ඔවුන්ගේ ගීත රසවිඳීමටත් අවස්ථාවන් ලබා දී තිබෙනවා. මෙකී වැඩ සටහන් ඉදිරි වර්ෂයේදී ද කළ යුතු යැයි මා අදහස් කරන අතර ඒ සඳහා රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

පෞද්ගලික අංශයෙන් නඩත්තු කරන ළමා රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන රාශියක් අප පළාතේ තිබෙනවා. අප ඒවා අධීක්ෂණය කරනවා පමණක් නෙමෙයි මූල්‍ය ආධාර ද ලබා දෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ එම නිවාසයක සිටින දරුවෙකු වෙනුවෙන් දිනකට ලබා දුන්නේ රුපියල් 20 ක මූල්‍ය ආධාරයක්. නමුත් මෙම වර්ෂයේ සිට එය රුපියල් 40 දක්වා වැඩි කළ අතර එය දිගටම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා. වර්තමානයේ දරුවන්ගේ පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම ඉතා ඉහළයි. එම කාර්යයේදී දරුවන් වැඩිහිටියන් අභිබවා ඇති බව අප කවුරුත් දන්නා කරුණක්. අපගේ ආයතනගත දරුවන් ද මෙම පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම ලබා ගත යුතුයි. එම නිසා සෑම රැඳවුම් මධ්‍යස්ථානයකම කුඩා පරිගණක පුහුණු ඒකකයක් ඇති කළ යුතු යැයි මා යෝජනා කරනවා. ලබන වර්ෂයේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

**වැඩිහිටියන් රැක බලා ගැනීම**

ගරු සභාපතිතුමනි, වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය, මුළු ජනගහනයෙන් සියයට 9 ක් පමණ

වෙනවා. පසුගිය දශක තුන පුරාම මෙම ජනගහන කාණ්ඩයේ වර්ධනය වේගවත් වූ අතර මෙය 2030 පමණ වනවිට සියයට 22 දක්වා වැඩිවේ යැයි අපේක්ෂා කරනවා. අපේ පැරණි සමාජයේ මෙන් වැඩිහිටියන් සහ දරුවන් එකට ජීවත් වීමේ සමාජ රටාවක් ද වර්තමානයේ නැහැ. ලෝකය විශ්ව ගම්මානයක් වීමත් සමග එයට අනුගතව දරුවන් වැඩිහිටියන්ගෙන් ඈත් වෙනවා. ඒ සම්බන්ධව දරුවන්ට ද චෝදනා නගන්න හොඳ නැහැ. වැඩිහිටියන් රැක බලා ගැනීමේ ක්‍රමවේදයක් ජන සමාජය තුළින් ගොඩ නැංවිය යුතුයි. අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධ විශාල කාර්යභාරයක් කරනවා. වැඩිහිටියන් වෙනුවෙන් ඔවුන් ආරක්ෂා කිරීමට, ඔවුන් හුදකලා නොකිරීමට වැඩ සටහන් රාශියක් කරනවා. එම කාර්යය අප දිරිමත් කළයුතු අතර, ඒ සඳහා තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

වර්තමානයේ වර්ෂයකට වැඩිහිටියන් 80,000 කට පමණ නොයෙක් ක්ෂේත්‍ර ඔස්සේ මූල්‍යාධාර ලබා දෙනවා. ඒ සඳහා වර්ෂයකට රුපියල් මිලියන 290 ක් පමණ වෙන් කරනවා. මෙම මුදල වර්ෂයක් පාසා වැඩි කළත් ආධාර ලබා දෙන වැඩිහිටියන් වැඩි කර ගතයුතු යැයි මා සිතන්නේ නැහැ. ඔවුන්ට කුමන හෝ යැපුම් මාර්ග සකසා දී මෙම සංඛ්‍යාව අඩුකර ගත යුතුයි. ඔවුන්ට දවසකට පැය 2 ක් හෝ 3 ක් වැඩක නියැලීමට ඉඩදී මුදලක් උපයා ගැනීමට ඉඩ දිය යුතුයි. එය ඔවුන්ට මානසිකව මෙන්ම කායිකව ද හොඳ සුවයක් වෙනවා. මේ කෙරෙහි ද අවධානය යොමු කරමින් කටයුතු කිරීමට යටත්ව සමාජ සේවා දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 503 ක ප්‍රතිපාදන ලබන වර්ෂයට වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයකට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. දැන් හුඟක් වැඩිහිටි නිවාස පුද්ගලික ඒවා තිබෙනේන්. ඒවාට ප්‍රතිපාදන අපට දෙන්න අමාරුයි. ගොඩනැගිලි ඉදිකිරීම්වලට. නඩත්තුවලට. ඒ අනුව මම හිතන්නේ ඉදිරියේදී වැඩිවන ප්‍රතිශතයට අනුව අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා මධ්‍යස්ථාන තුනක් මේ දිස්ත්‍රික්ක තුනේ ආරම්භ කළ යුතුයි කියලා මම යෝජනා කරනවා.

**කාන්තාවන් සවිබල ගැන්වීම**

ගරු ඇමැතිතුමා නොකරන එක.

ගරු සභාපතිතුමනි, අප රටේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය සියයට 36 ක්. විශ්ව විද්‍යාල උපාධිධාරීන්ගෙන් සියයට 50 ක් කාන්තාවන් වීම මෙම තත්ත්වයට හේතුවයි. නමුත් චීනය වැනි රටවල ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය සියයට 50 ට ආසන්න වෙලා. අප රටේ ප්‍රතිපත්තිය ද 2025 වන විට මෙය සියයට 40 දක්වා වැඩිකර ගැනීමයි. වර්තමානයේ සොයා ගත් කරුණු අනුව පෙන්වා දී ඇත්තේ, ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය අඩු වීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ගුණාත්මක බවින් ඉහළ ළමා සුරැකුම් හා වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන නොමැති වීමයි. එම නිසා රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල ළමා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමට කටයුතු කළ යුතු යැයි මම යෝජනා කරනවා. ප්‍රජාව නියෝජනය කිරීමේදී කාන්තා සහභාගීත්වය වැඩිකර ගැනීම කළ යුතුයි. අප පළාත් සභාවේ කාන්තා සහභාගීත්වය සියයට 5 යි.

සියයට 5 ක් ඇවිල්ලා මෙහෙම නම් සියයට 50 ක් ආවොත් සිරිකමල්ලාගේ කොණ්ඩේ ඉතුරු වෙන එකකුත් නැහැ.

මධ්‍යම පළාත් සභාවේත් එය සියයට 5යි. ඉදිරි කාලයේදී හෝ එම දායකත්වය වැඩිවන්නේ නම් එය යහපත් ප්‍රවණතාවයක් හැටියට මා දකිනවා. එමගින් තීරණ ගැනීමේ දී ඔවුන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට හැකි වෙනවා.

ගරු සභාපතිතුමාට දැනට තිබෙන කොණ්ඩය ඊළඟ පළාත් සභාවේදී ආරක්ෂා කරගන්න බැරිව යනවා.

**කාර්මික සංවර්ධනය**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ පේෂ කර්මාන්ත, කුඩා කර්මාන්ත සහ හස්ත කර්මාන්තයන්හි තිරසාර සංවර්ධනය සහ ඒවායේ නියැලෙන්නන්ගේ ආදායම් ඉපයීම සමතුලිත තත්ත්වයේ පවත්වා ගැනීම කර්මාන්ත පිළිබඳ අපගේ දැක්මයි. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පේෂ කර්මාන්ත නිෂ්පාදන මධ්‍යස්ථාන 54 ක් පවතින අතර ඒවා අලෙවි කිරීම සඳහා අලෙවිසැල් 14 ක් ක්‍රියාත්මක වෙනවා. පවුල් 400 කට වැඩි සංඛ්‍යාවක් අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයෙන් සිය ජීවිකාව පවත්වාගෙන යනවා. පළාතේ පුහුණු මධ්‍යස්ථාන 96 ක් තුළ පුහුණුව ලබා

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

වාර්ෂිකව 1,000 කට වැඩි සංඛ්‍යාවක් ඉන් පිටවන අතර සියයට 75කට වැඩි ප්‍රමාණයක් ලබාගත් පුහුණුව මගින් ස්වයං රැකියා තුළ නියැලෙනවා.

මෙම පුහුණුලාභීන් සඳහා දැනට රුපියල් 5,000 ක මාසික පැමිණීමේ දීමනාවක් ගෙවනවා. එය කිසිසේත් ප්‍රමාණවත් නැති බව මාගේ අදහසයි. තරුණ තරුණියන් වැඩි වැඩියෙන් මෙම පුහුණුව සඳහා නැඹුරු කරගත යුතුයි. එම නිසා ලබන වර්ෂයේ සිට මෙම පැමිණීමේ දීමනාව රුපියල් 7,500 දක්වා වැඩි කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, පුහුණුවෙන් පසු ලබා දෙනු ලබන සහතිකය සඳහා රට තුළ සහ ජාත්‍යන්තරව පිළිගැනීමක් පැවතීම ඉතා වැදගත්. ඒ සඳහා එම සහතිකය NVQ මට්ටමකට ආදේශ කර ගැනීම කළ යුතුයි. මෙතෙක් එම කටයුතු සිදු නොවී පැවතීම හොඳ තත්ත්වයක් නොවෙයි. එම නිසා අපගේ පුහුණු සහතිකය NVQ 4 මට්ටමට ආදේශ කර ගැනීමට කටයුතු කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

පළාතේ ග්‍රාමීය ජනතාව වැඩි වැඩියෙන් කුඩා කර්මාන්ත සහ හස්ත කර්මාන්ත කෙරේ නැඹුරු කර ගැනීම කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වගකීමක්. එය ඉටු කිරීම සඳහා මෙම ආයතන දෙකට 2017 වර්ෂයේදී රුපියල් මිලියන 286 ප්‍රතිපාදන සලසා දුන් අතර 2018 වර්ෂය සඳහා රුපියල් මිලියන 290 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

**සමුපකාර ව්‍යවසාය**

ගරු සභාපතිතුමනි, රටතුළ ක්‍රියාත්මක පෞද්ගලික සහ රාජ්‍ය ව්‍යවසායක ක්‍රම හැරුණු විට තුන්වන ස්ථානය ගනු ලබන්නේ සමුපකාර ව්‍යවසායයි. සමුපකාර ක්ෂේත්‍රය දීර්ඝ ඉතිහාසයක් පවතින, රටතුළ පමණක් නොව ලෝකය පුරා ක්‍රියාත්මක ස්වේච්ඡා සංවිධාන ව්‍යුහයක්. තම කටයුතු සිදු කර ගැනීම සඳහා ඒකරාශී වීම තුළ ගොඩනැගුණු මෙම සංවිධාන ව්‍යුහය තුළ වර්තමානය වනවිට ජාතික වශයෙන් ඒකරාශී වී ඇති සාමාජික සංඛ්‍යාව ලක්ෂ 82 ක් පමණ වන අතර බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක සමිතිවල සාමාජික සංඛ්‍යාව ලක්ෂ 18ක් පමණ වෙනවා.

තොරතුරු තාක්ෂණය, සංචාරක ව්‍යාපාර වැනි අංශ සමඟ සැසඳීමේදී සමුපකාර ක්ෂේත්‍රයේ වැටුප් මට්ටමත්, එහි වර්ධනයත් ඉතාම පහළ මට්ටමක පැවතීම කනගාටුදායක තත්ත්වයක්. සමුපකාර සේවකයෙකුගේ වැටුප තම ජීවන මට්ටම පවත්වාගෙන යාමට කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. එම නිසා ඔවුන්ට නිවාඩු දිනයන්හි සහ රාත්‍රී කාලයේ වෙනත් රැකියාවන්හි නියුක්ත වීමට සිදු වෙලා. ඉදිරි වර්ෂ දෙක තුළ සෑම විවිධ සේවා සමුපකාර සමිතියක්ම තම සේවකයින්ගේ වැටුප කුමන හෝ ප්‍රමාණයකින් වැඩි කළ යුතු යැයි මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, ඉහත කාර්යයන් කිරීම සඳහා දුර්වල සහ අකාර්යක්ෂම පාලන තන්ත්‍රයන්ගෙන් සමුපකාරය ගලවා ගත යුතුයි. ඒ සඳහා පවතින නීති සහ රෙගුලාසි වෙනස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්. එම නිසා සමුපකාර ප්‍රඥප්තිය, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය සහ කොමිෂන් සභා ප්‍රඥප්තිය සංශෝධනය කිරීමටත්, විවිධ සේවා සමුපකාර සමිති සඳහා නව අතුරු ව්‍යවස්ථාවක් හඳුන්වාදීමටත්, මූල්‍ය සේවා සමුපකාර සමිති සඳහා කාරක නියෝග මාලාවක් හඳුන්වා දීමටත්, ග්‍රාමීය බැංකු සඳහා කාර්යය රීති සංග්‍රහයක් හඳුන්වා දීමටත් බලාපොරොත්තු වෙනවා.

මම දකින දෙයක් තමයි ගමනා ගමන මණ්ඩලයත්, සමුපකාරයත් ගත්තොත් දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ. ඒ ආයතන දෙකේම දියුණුවට මේ දේශපාලනීකරණය වීම බාධාවක්ව පවතිනවා. අපට සමුපකාරය සිහි වෙන්නේ - දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ අපේ ඇමැතිතුමා හින්දා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඡන්දය තියන්නෙත් නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දේශපාලනය වෙලා තිබෙන්නේ අපේ ඇමැතිතුමා හින්දා. ඒ වාගේම අපට ජාතික පීඩාවක්, ව්‍යසනයක් වුණාම, මොකක් හරි ජාතික පීඩාවක් වුණාම අපට සිහිවෙන්නේ සමුපකාරය. Food city නොවෙයි. ඒ නිසා අපි සමුපකාරය ආරක්ෂා කර ගන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා.

## ප්‍රවාහන කටයුතු

ගරු සභාපතිතුමනි, ආර්ථික සංවර්ධනයේදී ප්‍රවාහන ජාලය ප්‍රධාන භූමිකාවක් ඉටු කරනවා. ජනතාව රැකියාවන් සඳහා සම්බන්ධ කරවීමටත්, නිෂ්පාදිත භාණ්ඩ වෙළෙඳපොළ කරා ගෙන යෑමටත්, අධ්‍යාපනය වැනි ප්‍රධාන සේවාවන් කෙරෙහි ප්‍රවේශ වීමටත් ප්‍රවාහන ජාලය ඉතා වැදගත්. සමස්ත මගී ප්‍රවාහන සේවයේදී පෞද්ගලික බස් රථ වැඩි දායකත්වයක් දක්වන නිසා මෙතෙක් අපගේ වැඩි අවධානයක් යොමු වූයේ පෞද්ගලික බස් රථ නියාමනය සම්බන්ධවයි. නමුත් ත්‍රීරෝද රථ ග්‍රාමීය සහ නාගරික යන දෙඅංශය තුළම ඉතා වැදගත් ප්‍රවාහන මාධ්‍යයක් බවට පත්ව තිබෙනවා. නියාමන ක්‍රමවේදයේ පවතින අඩුපාඩු නිසා මෙම කර්මාන්තය වර්ධනය වනුයේ අක්‍රමවත් ලෙසයි. මෙම තත්ත්වය පාසල් වෑන් රථ සහ කාර්යාලයීය වෑන් රථ අංශයට ද පොදුයි. වර්තමානයේ වැඩිදුර අධ්‍යාපනයක් නොලබන තරුණ පරපුරෙන් වැඩි කොටසක් ත්‍රීරෝද රථ ක්‍රියාකරුවන් බවට පත්වෙලා. මොවුන්ගෙන් රටේ නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය ඉතාම අල්පයි. වැඩියෙන්ම අනතුරුවලට ලක්වන්නේද ත්‍රීරෝද රථයි. එම නිසා ත්‍රීරෝද රථ සහ පාසල් වෑන් රථ නියාමන ක්‍රමවේදය ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතුයි. පාසැල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ හිමියන්ට ආසන 32 බස් රථවලට මාරු වීමට ද දිරි ගැන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස මගී ප්‍රවාහන අධිකාරියට මා දැනටමත් උපදෙස් දී තිබෙනවා. මෙහි මූලික කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ නව තාක්ෂණික උපාංග පරිහරණය වැඩි දියුණු කිරීමේ අරමුණින් පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය හැකිතාක් ප්‍රචලිත කළ යුතුයි. මෙමඟින් මගියාට ද විශාල පහසුවක් අත්වනවා මෙන්ම බස් රථ හිමියාගේ ආදායම ද සුරක්ෂිත වෙනවා. පළාතේ දැනට භාවිතා වන පෙර ගෙවුම් කාඩ්පත් ප්‍රමාණය 7,000 ක් පමණ වන අතර ලබන වර්ෂය තුළ එය 25,000 ක් දක්වා වර්ධනය කර ගැනීම අපගේ ඉලක්කයයි.

ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා.

බස් නැවතුම්පළවල් සංවර්ධනයේදී ඒවායේ ඉහළ මහල්වල සාප්පු සංකීර්ණ ඇති කිරීම ඉතා අසාර්ථක ක්‍රමයක් හැටියටයි මා දකින්නේ. ගරු ඇමතිතුමනි, අපි ඒවා ඉදි කළාට ඒවා කාර්යක්ෂම වෙලා නැහැ. ඒවායෙන් අපේ ඉලක්ක සම්පූර්ණ වෙලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒවායේ වෙළෙඳාමක් නොපවතින අතර එම නිසා ඒවායෙන් ලැබිය යුතු ආදායම ද එකතු කර ගැනීමට නොහැකි වී තිබෙනවා. පානදුර, හෝමාගම වැනි බස් නැවතුම්පළවල්වල පවතින තත්ත්වය පිළිබඳව ඔබතුමාගේ අවධානය මම යොමු කරන්න කැමැතියි. එම බස් නැවතුම්පලවල්වල තිබෙන වෙළෙඳසැල් වෙනත් කුමන හෝ කාර්යයකට යොදවන ලෙස මා ඉල්ලා සිටින අතර මින් ඉදිරියට එවැනි ඉදි කිරීම් කිරීමේදී සාප්පු සංකීර්ණ ඉදි නොකළ යුතුයි. ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා මගී ප්‍රවාහන අධිකාරිය වෙනුවෙන් රුපියල් මිලියන 230 ක් වෙන් කරනවා.

## පළාත් මාර්ග සංවර්ධනය

ගරු සභාපතිතුමනි, 2005 වර්ෂය වන විට බස්නාහිර පළාතේ පවතින C සහ D ශ්‍රේණියේ මාර්ගවලින් කාපට් අතුරා සංවර්ධනය කර තිබුණේ සියයට 5 ක පමණ ප්‍රමාණයක්. නමුත් මේ වනවිට සියයට 75 ක් පමණ කාපට් අතුරා සංවර්ධනය කර තිබෙනවා. 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන අයි - රෝඩ් – 02 ව්‍යාපෘතිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝ මීටර් 97 ක් ද, කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් 60 ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් 58 ක් ද ලෙස මුළු මාර්ග කිලෝමීටර් 215 ක් කාපට් අතුරා සංවර්ධනය කරනවා. එය අවසන් වන විට පළාතේ C සහ D මාර්ගවලින් සියයට 85 ක් කාපට් අතුරා සංවර්ධනය කළ මාර්ග බවට පත් වෙනවා.

2017 වර්ෂයේ මැයි මාසයේ සිදුවූ අධික වර්ෂාව නිසා ඇති වූ හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් මාර්ග නිර්මිතවලට විශාල වශයෙන් හානි සිදු වුණා. කළුතර දිස්ත්‍රික්කයේ වැඩි මාර්ග ප්‍රමාණයක් හානි වූ අතර ඒ සඳහා රුපියල් මිලියන 312 ක් රජයෙන් ලැබී එම මුදල් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදවා ඇති අතර වර්ෂය අවසන් වීමට පෙර එම සියලු මාර්ග යථා තත්ත්වයට පත් කරනවා.

මා බලයට පත් වූ පසු පළාත් පාලන ආයතනවල මුදල් ද වැඩි ප්‍රමාණයක් මෙම පළාතේ මාර්ග සංවර්ධනයට යෙදවීමට දිරිමත් කළා. දැන් සමහර පළාත් පාලන ආයතන තමන්ගේ මාර්ග කාපට් අතුරා සංවර්ධනය කර ගන්නවා.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ඔවුන් සතුව පවතිනවා. මෙය අපගේ පාලන කාලය තුළ ලැබූ ජයග්‍රහණයක් වශයෙන් මා දකිනවා.

ගරු සභාපතිතුමනි, මේ කාපට් concept එක, අදහස අපි නේ ගෙනාවේ. අපි මහරගමින් පටන් ගත්තේ. ප්‍රාදේශීය සභා පාරවල්, නගර සභා පාරවල් කාපට් කරන්න ඕනෑය කියන එක. දැන් අපි ඒක ව්‍යාප්ත කරලා තිබෙනවා. මේ ළඟදී කැස්බෑවෙන් අපට විරුද්ධව පෝස්ටර් ගහලා තිබෙනවා, පාරවල් කාපට් කරනවාය කියලා. එහෙම අයත් අපේ පළාතේ ඉන්න බව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න ඕනෑ. කාපට් කරන්න එපාය කියලා. ගරු සභාපතිතුමනි, කාපට් කළාම විශාල ආර්ථික වාසියක් තිබෙනවා. කොන්ක්‍රීට් කරනවාට වඩා කාපට් කළාම ආර්ථික ලාභයක් තිබෙනවා. අපි ඒක සොයා ගත්තා. ඒ වාගේම නිකම් තාර දැම්මාම මාස හයෙන්, හතෙන් කැඩෙනවා. අර වාගේ කළාම අවුරුදු තිහක්, හතළිහක් පාරක් පාවිච්චි කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, කොන්ක්‍රීට් අතුරා මාර්ග සංවර්ධනය කිරීම කෙරෙහි ද අපගේ අවධානය යොමු කළ යුතුයි. කිලෝමීටර් 1 ක් කාපට් කිරීම සඳහා රුපියල් මිලියන 10 ක් පමණ වැයවන අතර, එය පවතිනුයේ අවුරුදු 15 ත් 20 ත් අතර ආයු කාලයක් පමණයි. කිලෝමීටර් 1 ක් යන්ත්‍ර මගින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 15 ක් පමණ වැය වන මුත්, අවුරුදු 50 ක පමණ ආයු කාලයක් එය පවතිනවා. මේ සඳහා අවශ්‍ය යන්ත්‍ර ද අප සතුව තිබෙනවා. යන්ත්‍ර මගින් දින 4 ක් තුළ කිලෝමීටර් 1 ක් කොන්ක්‍රීට් කරන්න පුළුවන්. නමුත් මූලික වියදම වැඩි නිසා කොන්ක්‍රීට් කිරීම කෙරේ අප අවධානය යොමු කරන්නේ නැහැ. එම නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටින්නේ මේ කෙරෙහි වැඩි ප්‍රවණතාවයක් දක්වන ලෙසයි. මාර්ග සංවර්ධන කටයුතු වෙනුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 800 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**නිවසක් හිමි පවුලක්**

ගරු සභාපතිතුමනි, යම් රටක ආර්ථිකයේ තත්ත්වය සහ එහි ජනතාවගේ යහපැවැත්ම පිළිබිඹු වන සාර්ථක දර්ශකයක් ලෙස එම රටේ නිවාස තත්ත්වය සැලකිය හැකි බවට ලොව පුරා පිළිගැනීමක් තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ අපගේ නිවාස දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වූයේ අඩු ආදායම්ලාභීන්ට නිවාස ආධාර ලබා දීමයි. එය රු.25,000/- වැනි ඉතාම සුළු ආධාර මුදලක් පමණයි. මෙම තත්ත්වය වෙනස් විය යුතු බවත්, ආධාර මුදල ප්‍රමාණවත් නොවන බවත්, නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතු බවත් පසුගිය වර්ෂයේ අයවැය ඉදිරිපත් කරමින් මා යෝජනා කළා. ඒ අනුව දැන් අපි රු.100,000/- ක නිවාස ආධාර මුදලක් ලබා දෙනවා. 2017 වර්ෂයේ මේ වන විට පවුල් 535 කට රුපියල් මිලියන 100 ක නිවාස ආධාර ලබා දී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ දරිද්‍රතාවය පිටු දැකීමේ වැඩසටහනට සමගාමීව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 තුළ නිවාස 40 ක් සෑදීමට දැනටමත් කටයුතු කර ඇති අතර මෙම වර්ෂය අවසන් වීමට පෙර ඒවා සියල්ල නිම කර භාර දීමට කටයුතු කරනවා.

2018 වර්ෂයේදී පවුල් 1,500 කට නිවාස ආධාර ලබා දීමට සැලසුම් කර ඇති අතර, රුපියල් මිලියන 110 ක් ඒ සඳහා වැය කිරීමට අපේක්ෂා කරනවා. එසේම ලබන වර්ෂය තුළදී පළාත තුළ නිවාස 100 ක් ඉදි කිරීමට අපේක්ෂා කර ඇති අතර ඒ සඳහා එක් නිවාසයකට වෙන් කර ඇති මුදල රුපියල් 150,000/- කි.

**කෘෂිකර්මාන්තය**

ගරු සභාපතිතුමනි, කෘෂිකර්මාන්තයට අපේ ආර්ථිකයේ, අපේ සමාජයේ සහ අපේ ජන ජීවිතයේ විශාල වැදගත්කමක් හිමි වෙනවා. කෘෂිකර්මය ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 200 ක් පමණ වැය කරනවා. අපි මේ සැරේ පළාත් කෘෂිකර්මයට බිලියන 200 ක් දීලා තිබෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

බිලියන.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඒක මිලියන ද? බිලියනද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. රජයේ එක මම කිව්වේ.

කෘෂිකර්මය ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා මධ්‍යම රජය වාර්ෂිකව රුපියල් බිලියන 200 ක් පමණ වැය කරනවා. කෘෂිකර්ම අංශයේ නිරත මිලියන 2.5 ක් පමණවන රටේ ජනතාවගෙන් වැඩි කොටසකගේ මාසික ආදායම දළ වශයෙන් රුපියල් 25,000 ක් පමණ වන අතර එය රටේ සාමාන්‍ය මාසික ආදායම වන රුපියල් 41,000 ට වඩා අඩුයි. මෙයට ප්‍රධාන හේතුව කෘෂිකාර්මික අංශය තවමත් යැපුම් මට්ටමේ පැවතීමයි. ඉඩම් කුඩා කැබලි වශයෙන් පැවතීම, නවීන තාක්ෂණය හා කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතයට නොගැනීම සහ ස්ථාවර කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම මෙය තවමත් යැපුම් මට්ටමේ පැවතීමට හේතු වෙලා. අඩු ඵලදායීතාවයක් සහ අඩු ආදායම් සහිත සීමිත භෝග ප්‍රමාණයක් මත රඳා පවතින යැපුම් කෘෂි කර්මාන්තය වාණිජ කර්මාන්තයක් බවට පරිවර්තනය කළ යුතුයි.

මේ සඳහා අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සිය උපරිමයෙන් කටයුතු කළත් ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුව තමයි වෙන් වන අරමුදල් ප්‍රමාණවත් නොවීම. වර්ෂ ගණනාවක් තිස්සේ අප පළාතේ කෘෂිකර්මාන්තය සඳහා වෙන් කරනුයේ අනෙකුත් විෂයයන් හා සැසඳීමේදී ඉතා සුළු ප්‍රතිපාදන මුදලක්. මේ කෙරෙහි මුදල් කොමිෂන් සභාවේ ද විශේෂ අවධානය යොමු විය යුතුයි. එම නිසා ලබන වර්ෂය සඳහා වෙනත් වර්ෂවලට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය වෙනුවෙන් වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මිලියන 400 ක ප්‍රමාණයක් එය අපි අධ්‍යාපනයට වෙන් කරපු මුදලම, අපේ ප්‍රතිපාදනවලින් කෘෂිකර්මාන්තයට අපි වෙන් කරලා තිබෙනවා. මොකද, ඇමතිතුමා මේ කෘෂිකර්මාන්තය, මේ කර්මාන්තය ගොඩ නගන්න විශාල උත්සාහයක් ගන්නවා. ධෛර්යයක් ගන්නවා. ඉතින් අපි ඒක අගය කරමින්, මිලියන 400 ක් විතරක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාගේ වැඩ සටහන, මේ තිරසාර සංවර්ධනය සඳහා මේ රට ගොඩ නගන වැඩ සටහන ශක්තිමත් කරන්න, මේ ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න ඔබතුමාට මිලියන 400 ක් නොවෙයි. තවත් ඉදිරියේදී අපි ලබා දෙන්න කටයුතු කරන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. කැස්බෑවේ වැව අපි දැන් සංවර්ධනය කරලා ලබන මාසේ විවෘත කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වැවේ නාන්න එන්නය කියලා ඒ ප්‍රදේශය නියෝජනය කරන අපේ මන්ත්‍රීවරු දෙන්නාටම අපි ආරාධනා කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගණිකා මඩමක් දාලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ නිරෝෂන් මන්ත්‍රීතුමා කිව්වා බස්නාහිර පළාතෙන් ගණිකා මඩමක් දාලා කියලා. බස්නාහිර පළාතෙන් අපි නම් තවම මුකුත් හෝටලයක් දැම්මේ නැහැ. ගරු සභාපතිතුමනි, අපි දැන් හෝටල් කිහිපයක් මිලදී ගන්න යන එක නම් ඇත්ත. තවම අපි එහෙම එකක් මිලදී ගත්තේ නැහැ.

ගොවීන්ගේ ගුණාත්මක නිෂ්පාදන සඳහා හොඳ වෙළෙඳපොලක් සකසා දීමේ අරමුණින් “*යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන*” හා “*කොම්පොස්ට් සහතිකකරණ වැඩසටහන*” කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනවා. එහිදී එළවළු සහ පලතුරු වගාවේ මුල සිට අග දක්වා ම, යහපත් කෘෂි පිළිවෙත් යටතේ සහ කාබනික නිෂ්පාදිත වශයෙන් වගා කරන බවට තාක්ෂණික නිලධාරීන්ගේ සමීප අධීක්ෂණය මගින් සහතික කිරීමක් සිදු වෙනවා.

මෙම සේවාව මගින් ජාතික පැළෑටි නිරෝධායන සේවාවේ විගණනය යටතේ ශ්‍රී ලාංකික යහපත් කෘෂි පිළිවෙත් හා කාබනික නිෂ්පාදන සහතිකකරණයක් ලබා දෙනවා. ඒ වගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා ඇති පාලන මැදිරිය මගින් අපනයන කෘෂි නිෂ්පාදන ප්‍රමිතකරණය යටතේ නිපදවා ශ්‍රේණිගත කිරීම, ඇසුරුම් කිරීම, සැකසුම් කිරීම යන මුළු ක්‍රියාදාමයම අධීක්ෂණය කර, එම නිෂ්පාදනය අනුරේඛනය (Traceability) සිදුකර අවශ්‍ය සංකේතාංක (Codes) ලබා දීමක් සිදු කරනවා. මෙම ක්‍රියාවලිය තුළින් ගොවියාට තම අස්වැන්නට ඉහළ වටිනාකමක් ලබා දීම අපේ අරමුණයි.

ඒ වාගේම කෘෂිකර්මාන්තය තුළ සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයත් ආරක්ෂා කර ගනිමින්, විශේෂයෙන්ම

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

කාබනික පොහොරවලින් සමන්විත, දේශීය ආහාරයට සුදුසු කෘතිම පොහොර යොදා නොගන්නා කෘෂිකර්මාන්තයක් ගොඩ නැගීම සඳහා විශේෂයෙන්ම දියුණු තාක්ෂණයත්, අපගේ ස්වභාවික සම්පතුත් උපයෝගී කර ගෙන අලුත් ගමනක් ප්‍රතිනිර්මාණය කරන්න කියලා අපේ ගරු ඇමතිතුමාට මම යෝජනා කරන්න කැමැතියි.

**පශු සම්පත් සංවර්ධන කටයුතු**

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට සමගාමීව කිරි, බිත්තර, මස් නිෂ්පාදනය වැඩි කිරීමේ 2016 - 2018 තුන් අවුරුදු සැලැස්මක් යටතේ දැනට අප කටයුතු කරනවා. බස්නාහිර පළාතේ විශේෂයෙන් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි නාගරීකරණය සහ කාර්මීකරණය හේතුවෙන් ගව පාලනය සඳහා භාවිතා කළ ස්වාභාවික තෘණ බිම් හා වගුරු බිම් ක්‍රමයෙන් අඩු වීමත්, පළාත් පාලන ආයතන සහ පාරිසරික අංශ මැදිහත් වී ගොවිපළවල් වසා දැමීමත් පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන ප්‍රබල ගැටළුවක්. මේ තුළින් සත්ත්ව පාලන ගොවිපළවල් සංඛ්‍යාව අඩුවීමත්, සතුන් සංඛ්‍යාව අඩුවීමත් සිදුවෙලා. එසේ වුවත් නවීන තාක්ෂණය සහ ගොවිපොළ යාන්ත්‍රීකරණය තුළින් 2018 වන විට වර්ෂයකට කිරි ලීටර් මිලියන 35 ක්, බිත්තර මිලියන 231 ක් සහ මස් කිලෝග්‍රෑම් මිලියන 39 ක් ලබා ගැනීම අප පළාතේ ඉලක්කය යි.

ගරු සභාපතිතුමනි, මේ ළඟදී ඉතාමත් කනගාටුදායක සිද්ධියක් අපි දැක්කා. අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පැවැත්වූ මේ හොඳම ගවයින් තේරීමේ තරඟයේ ප්‍රථම ස්ථානයට පත් වුණු ගවයා පහුවෙනිදා උදේ පැහැරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කොහේද? මහරගම නොවෙයි නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කැස්බෑවේ නේද? ඒක බොහොම කනගාටුදායක තත්ත්වයක්. අද සම්ප්‍රදායික අහිංසක ගොවියන් මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය සෝෂා කිරීම් කරන්න එපා. එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කිරි ගොවියන් අද මුහුණ දෙන ප්‍රශ්නයක්. කාලයක සිට කණ්ඩායමක් මේ දේ කරනවා. පාන්දරට ඇවිල්ලා මේ ගම්වල ඉන්න ගවයන්ව බලහත්කාරයෙන් අරගෙන යනවා. ටී 56 තුවක්කු අරගෙන එන්නේ. ඒ නිසා මේ පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

2015 වර්ෂය වන විට රටේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 375 දක්වා වර්ධනය වුවත්, අපි තවමත් වර්ෂයකට කිරි පිටි මෙට්‍රික් ටොන් 81,000 ක් පමණ ආනයනය කරනවා. ඒ සඳහා ප්‍රමාණවත් පරිදි දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීමට නම් ගවයින් 15,000 ක් පමණ අවශ්‍යයි. ඒ සඳහා අප පළාතේ දායකත්වය ද ලබා දිය යුතුයි.

සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව ලබා ගත් බීජ රක්වන යන්ත්‍ර භාවිතයෙන් මේ වන විට බස්නාහිර පළාතේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන සියලු කුකුළු පැටවු නිෂ්පාදනය සිදු වෙනවා. මීට පෙර පෞද්ගලික අංශයෙන් රුපියල් 400 කට ලබා ගත් මසක් වයසැති කුකුළු පැටියෙක් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවෙන් රුපියල් 265 කට ලබා ගන්න පුළුවන්. හරි නේද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ප්‍රයිවට් 400 ට ගත්තේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පුද්ගලික අංශයෙන් රු. 400 ක් දීලා ගන්නවාට වඩා අපි හදලා 200 ට දෙන එක හොඳ නැද්ද? මම දන්නේ නැහැ කිකිළි හැදුවාද? ඇමතිතුමා හැදුවාද කියලා. 265 ට ගන්න එක ලොකු ලාභයක්.

කුකුල් මස් නිෂ්පාදනයේ ප්‍රධාන ගැටළුවක් තමයි කුකුළන්ට ලබා දෙන ආහාරවල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ

යෑම. මෙය සුළු පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රධාන අභියෝගයක් වෙලා. කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය බඩ ඉරිඟුයි. අප රටේ වාර්ෂික බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 225,000 ක් වන විට අපගේ වාර්ෂික අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 400,000 ක්. අප පළාතේ බඩ ඉරිඟු සුලබව වගා නොකළත් ඒ කෙරෙහි ද අපගේ අවධානය යොමුකර බඩ ඉරිඟු නිෂ්පාදනයට ගොවීන් යොමු කළ යුතුයි.

නොයෙක් ලෙඩ රෝග සෑදී ගවයින්, කුකුළන් ආදී සතුන් ක්ෂණිකව මිය යෑම ද ගොවීන්ට පවතින ගැටළුවක්. අපගේ සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව සතුන්ට එන්නත් සහ බෙහෙත් ලබා දීම නිරන්තරයෙන් සිදු කළත් ඒ සඳහා ප්‍රබල අවධානයක් යොමු කළ යුතු වෙනවා. එකවර ගවයින් කිහිප දෙනෙකු මිය ගියහොත් මුළු ව්‍යාපාරයම අඩාල වීමට එය හේතු වෙනවා. එමනිසා අපගේ ඉලක්ක ළඟා කර ගැනීමට නම් නිරන්තර සුපරීක්ෂාවෙන් සිට ව්‍යවසායකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දිය යුතුයි. එවැනි යටිතල පහසුකම් සැපයීම ඇතුළු සියලු කාර්යයන් සඳහා සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 318 ක ප්‍රතිපාදන 2018 වර්ෂය වෙනුවෙන් වෙන් කරනවා.

**ඉඩම් බලතල**

ගරු සභාපතිතුමනි, ඉඩම් පිළිබඳව පළාත් සභාවට ලැබී ඇති බලතල ඉතා සීමිත බව අප කවුරුත් දන්නා කරුණක්. අපේ පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව ඉඩම් බැහැර කිරීමේ කාර්යයේදී ඉතා හොඳ ප්‍රගතියක් අප ලබා තිබෙනවා. 2017 වර්ෂයේ දී ඉඩම් කැබලි 1,306 ක් බැහැර කිරීම ඉලක්ක ගත කර තිබූ අතර 2017 අගෝස්තු වන විට ඉඩම් කැබලි 848 ක් බැහැර කර තිබෙනවා. 2018 වර්ෂය තුළදී ඉඩම් කට්ටි 1,205 ක් බැහැර කිරීමට අපේක්ෂා කරනවා.

ගරු සභාපතිතුමනි, අනෙකුත් කාර්යයන්ගෙන් අප සාර්ථකප්‍රතිඵල අත්කර ගත්තත් හිඟ ඉඩම් බදු එකතු කර ගැනීම තුළින් අප තවමත් සිටින්නේ ඉතාම දුර්වල තත්ත්වයකයි. කොළඹ දිස්ත්‍රික්කයේ සමහර බදුකරුවන් පිළිබඳ සලකා බැලුවහොත් රුපියල් මිලියන 100 ට වැඩි හිඟ බදු පවතින බදුකරුවන් සිටිනවා. මේ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමේදී ගැටළුකාරී තත්ත්වයන් මතු වෙනවා. බදු ආදායම් පමණක් පළාත් සභාවට හිමිවීමත් අනෙකුත් සියලු බලතල රජය සතුවීමත් මෙයට ප්‍රධාන හේතුවයි. මේ සම්බන්ධව අප සැමගේම විශේෂ අවධානය යොමු විය යුතුයි. අපගේ ආදායම් ප්‍රවර්ධන කමිටුව ද මේ පිළිබඳ සියලු තොරතුරු සොයමින් නීත්‍යානුකූලව කටයුතු කිරීම පිළිබඳ අවධානය යොමුකර තිබෙනවා. පසුගිය අයවැයේදී මා ප්‍රකාශ කළ පරිදි මෙම හිඟ ආදායම් එකතු කර ගැනීමට අවශ්‍ය කටයුතු හැකි උපරිමයෙන් සිදු කරන බවට මා මෙම ගරු සභාවට පොරොන්දු වෙනවා.

**ධීවර කටයුතු**

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මත යුරෝපා සංගමය විසින් පනවා තිබූ තහනම අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් පසුගිය වර්ෂයේ දී ඉවත් කර ගැනිමට අපට හැකි වුණා. එම ඉවත් කිරීමත් සමගම මත්ස්‍ය ප්‍රභේද සඳහා වන යුරෝපා සංගමයේ රටවල්වලින් වන ඉල්ලුම විශාල ලෙස වැඩි වී තිබෙනවා. ඒ අනුව පසුගිය වර්ෂයේ යුරෝපා සංගමයේ රටවල් වෙත කරන ලද අපනයනය මෙට්‍රික් ටොන් 2,540 ක් දක්වා එනම් සියයට 23.1 කින් වර්ධනය වී තිබෙනවා. ඒ වාගේම නිසි ප්‍රමිතියකින් තොරව ධීවර කටයුතුවල නියැලීම හේතුවෙන් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 25 ක් පමණ අපතේ යන බව හෙළි වී තිබෙනවා. මෙම අපතේ යෑම අවම කිරීමට අවධානය යොමු කිරීම ධීවර කර්මාන්තයේ උපරිම ඵල නෙලා ගැනීමට ඉතාම වැදගත්. විසිතුරු මත්ස්‍ය වගාව සහ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, උපාය මාර්ග සංවර්ධන සැලැස්ම අනුව අපගේ ප්‍රධාන ඉලක්කයන් දෙකක්. ඒ අනුව 2018 වන විට වර්ෂයකට විසිතුරු මසුන් ලක්ෂ 16 ක් වගා කර ගැනීමත්, කිලෝග්‍රෑම් 20,000 ක මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කර ගැනීමත් අපගේ ප්‍රධාන අපේක්ෂාවන් වෙනවා. ඒ සඳහා මෙම වර්ෂයේ ද ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ලබන වර්ෂය සඳහා ද මෙම මුදල් ප්‍රකාශය යටතේ ප්‍රතිපාදන සලසනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම වැව්වල මාලු හදන්න පුළුවන් නම් විශාල ඉල්ලුමක් තිබෙනවා. එහෙත් මෙහෙන් ගෙනැල්ලා විකුණන තැන් දෙක තුනක බැලුවාම විශාල ඉල්ලුමක් තිබෙනව බව පේනවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාට කියමු වැව්වල මාලු හදන්න පටන් ගන්නය කියලා. විශේෂයෙන්ම කැස්බෑවේ වැවේ.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

**වාරිමාර්ග සංවර්ධනය**

ගරු සභාපතිතුමනි,පළාත් සභාවට වෙන් වන ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ විශාල මුදලක් වාරිමාර්ග කටයුතුවලට වෙන් කළ නොහැකි අතර මහා පරිමාණ වාරිමාර්ග කටයුතු ද අප වෙත පැවරී නැහැ. ඒ අනුව ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය, නව අමුණු ඉදි කිරීම සහ අමුණු ප්‍රතිසංස්කරණය, වැව් ප්‍රතිසංස්කරණය, පැතිබැම් ඉදි කිරීම සහ කුඹුරුවලට ප්‍රවේශ වීමේ හැකියාවන් ඇති කිරීම අප වෙත පැවරී ඇති කාර්යයන්. පසුගිය වර්ෂ දෙක තුළ මෙවැනි කාර්යයන් සඳහා රුපියල් මිලියන 250 ක් වැය කර ව්‍යාපෘති රාශියක් කර තිබෙනවා. ලබන වර්ෂය තුළ ද මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් සලසනවා.

වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයේදී එස්කැවේටර් යන්ත්‍ර සහ බාජ් යන්ත්‍ර ඉතා අත්‍යාවශ්‍ය උපකරණයි. මෙම වර්ෂයේදී රුපියල් මිලියන 35 ක් වැයකර එම එම යන්ත්‍ර තුනක් ලබා ගැනීමට අපට පුළුවන් වුණා. එම යන්ත්‍ර දැනට දිස්ත්‍රික්ක තුනෙහි භාවිතා වන අතර එමගින් ඇළ මාර්ග ශුද්ධ කිරීම පහසු වී තිබෙනවා.

හොරණ කනේවෙල අමුණ නැවත ඉදිකිරීම වසර ගණනාවක් තිස්සේ ප්‍රමාද වෙලා. මෙම අමුණ නැවත ඉදි කළහොත් කුඹුරු අක්කර 105 කට ප්‍රමාණවත් ජලය ලබා දී කන්න දෙකෙහිම වී ගොවිතැන් කිරීමට හැකියාව ලැබෙනවා පමණක් නොවෙයි ගොවි පවුල් 300 කට පමණ සහන සැලසෙනවා. එම නිසා ලබන වර්ෂයේදී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමට මා බලාපොරොත්තු වෙනවා.

**නව ඉදිකිරීම්**

ගරු සභාපතිතුමනි, නවීන පහසුකම්වලින් යුත් තට්ටු 15 කින් සමන්විත නව ගොඩනැගිල්ලට ලබන වර්ෂයේදී අප ප්‍රවිෂ්ට වෙනවා. ඇතුළත ගෘහභාණ්ඩ ද ඇතුළුව මේ සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ වියදම රුපියල් මිලියන 7,029 ක්. දැනටමත් රුපියල් මිලියන 4,010 ක් වියදම් කර තිබෙනවා. ගොඩනැගිල්ලෙහි වැඩවලින් සියයට 85 ක් පමණ වැඩ දැනටමත් අවසන්. ඒ වගේම මෙම ගොඩනැගිල්ල "ඉ" රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල ඩිජිටල් තාක්ෂණ පහසුකම්වලින් යුක්ත පරිගණක පද්ධතියකින් සමන්විතයි. පාර්ලිමේන්තුවට පමණක් දෙවන වන අංගසම්පූර්ණ පහසුකම්වලින් සමන්විත සභා ශාලාවක් පවතිනවා. මෙය පළාතේ ඉදිවෙන පරිසර හිතකාමී හොඳම ගොඩනැගිල්ල බවට ඉදිරියේදී කාගේත් පැසසුමට ලක්වෙන බවට මාගේ දැඩි විශ්වාසයක් තිබෙනවා.

හැබැයි, ඒක හදලා ඉවර වුණාට පස්සේ නම් ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුව දෙක. අපි එක වෙනවා.

අපට තිබෙන විශාලම ගැටළුවක් තමයි ඉදි කිරීම් කටයුතුවලට අවශ්‍ය කාර්මික නිලධාරීන්ගේ හිඟය. බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳෙව්වත් සුදුසුකම් සහිත අය රට තුළ නොමැති නිසා ඉල්ලුම්පත් ලැබෙන්නේ නැහැ. එම නිසා බඳවා ගැනීමෙන් පසු කාර්මික නිලධාරීන් වශයෙන් ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා "*ඉංජිනේරු අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානයක්*" මෙම වර්ෂයේ ආරම්භ කළා. මෙම වර්ෂයේ ඒ සඳහා රුපියල් මිලියන 20 ක් වෙන් කර ඇති අතර ලබන වර්ෂයේදී රුපියල් මිලියන 36 ක් වෙන් කර එහි වැඩ අවසන් කරනවා.

ගරු සභාපතිතුමනි, පළාත් සභාවට අවුරුදු 25 කට වැඩි ඉතිහාසයක් තිබුණත් මෙතෙක් කල් ආණ්ඩුකාර තනතුරට නිල නිවාසයක් නොමැති වීම කනගාටුවට කරුණක්. එම නිසා මෙම වර්ෂයේ නිල නිවාසයක් ඉදි කිරීම ආරම්භ කළ අතර ඒ සඳහා රුපියල් මිලියන 50 ක් වෙන් කළා. ලබන වර්ෂයට රුපියල් මිලියන 75 ක් වෙන් කරමින් මැයි මස වන විට වැඩ අවසන් කිරීම අපේ බලාපොරොත්තුවයි.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් පහත කරුණ කියන්න කැමතියි. මෙම පළාත් සභාව අපගේ වගේම පළාතේ ජනතාවත් අපගේයි. පෞද්ගලික කැප කිරීම් කර අපි සැම දෙනාම මෙතැනට පැමිණ තිබෙන්නේ ජනතාවට සේවය කිරීමටයි. එම නිසා පටු වාද භේදවලින් ඉවත් වී එළදායී, අර්ථවත් විවේචන ඉදිරිපත් කරමින් මෙම අයවැය සම්මත කර ගැනීමට ඔබ සියලු දෙනාගේම සහය ලබා දෙන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ස්තුතිය**

මෙතෙක් වේලා අයවැය කථාවට සවන් දුන් ඔබ සියලු දෙනාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමැතියි. ඒ වාගේම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්,

අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු රජයේ ඇමතිවරුන්ටත්, අප සමග නිරන්තරයෙන් සුහදව කටයුතු කරන ගරු ආණ්ඩුකාරතුමාට ද, 2018 මුදල් ප්‍රකාශය පිළියෙල කිරීමේදී මහත් කැපවීමෙන් කටයුතු කළ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු පළාත් භාණ්ඩාගාරයේ බන්දුල ප්‍රේමකුමාර මහතා ඇතුළු අයවැය අංශයේ සියලු නිලධාරීන්ට ද, පළාතේ සියලු ලේකම්වරුන්ට ද, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ද, අනෙකුත් කාර්යාලවල ආයතන ප්‍රධානීන්ට ද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිනවා. එමෙන්ම වාර්තා කිරීමේ යෙදී සිටි - අද විශේෂයෙන්ම අපි මේ පළාත් සභාව විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ නිසා මේ පළාත් සභාවේ කෙරෙන කටයුතු රටේ පොදු ජනතාවට විවර කරන්න ඕනෑ නිසා, ඒ අය දැන ගන්න ඕනෑ නිසා අපි සියලුම මාධ්‍යවලට මෙවර ආරාධනා කළා, මේ අවස්ථාවට සම්බන්ධ වෙන්න කියලා. ඒ සියලුම ජනමාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතනවලට මගේ ස්තුතිය, ගෞරවය පුද කරන්න කැමැතියි. සංවිධාන කටයුතු සහ පහසුකම් සැපයූ සභා ලේකම් ඇතුළු එම කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ස්තුතිය පුද කරමින් මාගේ අයවැය කථාව අවසන් කරනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම ඔබතුමාට ආරාධනා කරනවා විසර්ජන ප්‍රඥප්තියත් ඉදිරිපත් කරන්න කියලා.

## 2018 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය
APPROPRIATION STATUTE RELEVANT TO THE ANNUAL FINANCIAL STATEMENT OF 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 මුදල් ප්‍රකාශය හා විසර්ජන ප්‍රඥප්තිය සම්බන්ධ ඉදිරි කටයුතු 2017 දෙසැම්බර් මස 05, 06, 07, 08, 11 සහ 12 යන දිනවලදී පැවැත්වෙන බව මම මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දෙනවා. එම දිනවල සභා රැස්වීම පෙ.ව. 9.00 ට ආරම්භ වන බවත් මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට නැවත වරක් සිහිපත් කරනවා. 9.00 ට ආරම්භ කරන්නේ. සවස 5.00 ට අවසන් වෙන්නේ.

ගරු මන්ත්‍රීතුමන්ලා ඡන්දය පැවැත්වෙන අවස්ථාවේ පමණක් නොවෙයි, ඒ දවස් හයේදීම සභාවට පැමිණෙන්න. ගණපූරණය ආරක්ෂා කර ගන්න. මෙම අයවැය විවාදය සාර්ථකව පවත්වාගෙන යාමට ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍යවරුන්ට ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න. බොහොම ස්තුතියි.

## කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා ප්‍රගතිශීලී අයවැය මේ අවස්ථාවේදී ඉදිරිපත් කළා. එතුමාගේ කථාවෙන් පස්සේ මට එළඹිලා තිබෙන්නේ, සභානායකවරයා හැටියට කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්නයි. ඒ අනුව,

ගරු සභාපතිතුමනි, *"දැන් සභාව කල් තැබිය යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 11.53 ට, 2017 දෙසැම්බර් මස 05 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 11.53 a.m till 09.00 a.m, on 05.12.2017.*